273 වන කාණ්ඩය - 7 වන කලාපය
தொகுதி 273 - இல. 7
Volume 273 - No. 7

2019 අගෝස්තු 06වන අඟහරුවාදා
2019 ஓகஸ்ட் 06, செவ்வாய்க்கிழமை
Tuesday, 06th August, 2019

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සාලින්ද දිසානායක මහතාගේ අභාවය

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

පොලිස් නිලධාරින්ට සංයුක්ත දීමනාව ලබා දීම
ජනාධිපති ජංගම සේවයේදී ජාතික හැඳුනුම්පත් නොමිලේ අයදුම් කළ පුද්ගලයන්

**ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත:**

ඉල්ලා අස්කර ගන්නා ලදී.

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**

பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு சாலிந்த திசாநாயக்கவினது மரணம்

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**

பொலிஸ் உத்தியோகத்தர்களுக்கு இணைந்த கொடுப்பனவு வழங்கல்

ஜனாதிபதி நடமாடும் சேவையில் இலவசமாக தேசிய அடையாள அட்டையைப் பெற விண்ணப்பித்தோர்

**இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம்:**

வாபஸ் பெறப்பட்டது

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Death of Hon. Salinda Dissanayake, Member of Parliament

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Grant of Combined Allowance to Police Officers
Applicants for Free National Identity Cards at Presidential Mobile Service

SRI LANKA ELECTRICITY (AMENDMENT) BILL:

Withdrawn

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

**2019 අගෝස්තු 06වන අඟහරුවාදා**
2019 ஓகஸ்ட் 06, செவ்வாய்க்கிழமை
Tuesday, 06th August, 2019

---

**අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் பி.ப.1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

# නිවේදන
# அறிவிப்புக்கள்
# ANNOUNCEMENTS

## පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සාලින්ද දිසානායක මහතාගේ අභාවය
## பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு சாலிந்த திசாநாயக்கவினது மரணம்
## DEATH OF HON. SALINDA DISSANAYAKE, MEMBER OF PARLIAMENT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු සාලින්ද දිසානායක මැතිතුමාගේ අභාවය මා මෙම පාර්ලිමේන්තුවට දන්වා සිටින්නේ බලවත් කනගාටුවෙනි. එතුමාගේ අභාවය නිසා අපට සිදු වී ඇති පාඩුව ගැන අප දැඩි සේ දුක්වන අතර, එතුමාගේ පවුලේ අය වෙත අපගේ සාතිශය සංවේගය ප්‍රකාශ කරන බව පාර්ලිමේන්තුව වෙනුවෙන් දන්වනු කැමැත්තෙමි.

මේ පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව මතු දිනයකදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ඇත.

# ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
# சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
# PAPERS PRESENTED

**ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவூப் ஹகீம் - நகரத் திட்டமிடல், நீர் வழங்கல் மற்றும் உயர் கல்வி அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning, Water Supply and Higher Education)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(ii) 2017 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(iii) 2017 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් වාර්තාව;

(iv) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(v) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(vi) 2017 වර්ෂය සඳහා මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව;

(vii) 2017 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(viii) 2017 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව; සහ

(ix) 2017 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය

බලශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් 2016 වර්ෂය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

එම වාර්තාව බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 52(2) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 58 වගන්තිය යටතේ තීරකවරයන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 08 දිනැති අංක 2113/63 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග;

(ii) 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 53(2) සහ 54(1)(අ) වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 58 වගන්තිය යටතේ අභියාචනා කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 28 දිනැති අංක 2116/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(iii) 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 55(2) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 58 වගන්තිය යටතේ තොරතුරු ලේකම් කාර්යාලය සම්බන්ධයෙන් නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 28 දිනැති අංක 2116/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග.

එම නියෝග සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු චන්දිම ගමගේ මහතා**
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

ගරු කථානායකතුමනි, බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, "ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

ගරු කථානායකතුමනි, මෙම ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය සලකා බැලීමට නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කරලා තිබෙනවා. ඒ අනුව අද උදේ ඒ සම්බන්ධ වාර්තාව අප වෙත ලැබුණා. නීති කෙටුම්පත් සම්පාදක විසින් සකසන ලද එම වාර්තාවේ සඳහන් සංශෝධන අද දින කාරක සභාවේදී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙන බව ප්‍රකාශ කර සිටිනවා.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - State Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, කුරුණෑගල, විල්ගොඩවත්ත, අංක 28 දරන ස්ථානයෙහි පදිංචි බී. සුවන්දුරුගොඩ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා (මහවැලි සංවර්ධන හා පරිසර රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith Mannapperuma - State Minister of Mahaweli Development and Environment)

ගරු කථානායකතුමනි, යක්කල, සිරිදෙරණවත්ත, අංක 48/15/1 දරන ස්ථානයෙහි පදිංචි ආර්.ඩී.ජේ.ආර්. ප්‍රියදර්ශණ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු කථානායකතුමනි, ගම්පොල හරහා, මීතලාව, මලංගමුව, "විජය ශ්‍රී නිවස" යන ලිපිනයෙහි පදිංචි ජේ.ආර්.ඒ.ආර්.ආර්. රණතුංග මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රංජිත් සියඹලාපිටිය මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

ගරු කථානායකතුමනි, මම ගොතටුව, නව නගරය, දොඩම්ගාන නිවාස යෝජනා ක්‍රමය යන ලිපිනයෙහි පදිංචි කරුණාරත්න වීරමන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හය පිළිගන්වමි.

(1) කළුතර - දකුණ, මුස්ලිම් පල්ලිය පාර, අංක 53-A දරන ස්ථානයෙහි පදිංචි ඒ.එල්.එම්. රිකාස් ෆාරුක් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) කඩුවෙල, කොරතොට, තුන්අදහේන, ඉසුරුසිරි උයන, අංක 656/28 දරන ස්ථානයෙහි පදිංචි ඩී. ලක්ෂ්මි දසනායක මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(3) කුරුණෑගල, පොතුහැර, අමුණුගම, අංක 365 දරන ස්ථානයෙහි පදිංචි කේ.එම්. කිරිබණ්ඩා මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) හිඹුටාන, ජයන්ති මාවත, අංක 276/4D දරන ස්ථානයෙහි පදිංචි. ඕ.එම්.ඩී. ගැමුණු මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) පානදුර, සිරිල් ජැන්ස් මාවත, අංක 88/5B දරන ස්ථානයෙහි පදිංචි රාජේන්ද්‍ර එස්. විජේසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(6) අඟුරුවාතොට, යාල, ඉවුඩුගොඩ යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එල්.ජී.ඩී.එම්. හර්ෂණ මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 - 4/'18 - (3), ගරු හේෂා විතානගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

### ලුණුගල බේසම්වල ප්‍රදේශය: පරිසර දූෂණය
### லுணுகல பேசம்வல பிரதேசம்: சூழல் மாசடைதல்
### LUNUGALA BESAMWALA AREA: ENVIRONMENTAL POLLUTION

132/'18

**2. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ "ලුණුගල බේසම්වල" නමින් සංචාරක අවධානයක් දිනාගත් ප්‍රදේශයක් තිබෙන බවත්;

(ii) එම ස්ථානය හා එම ස්ථානය අවට දැඩි පරිසර දූෂණයකට ලක් වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) එම ස්ථානයේ සිදුවන පරිසර දූෂණය අවම කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள்குடியேற்றம், புனர் வாழ்வளிப்பு, வடக்கு மாகாண அபிவிருத்தி மற்றும் இளைஞர் அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) பதுளை மாவட்டத்தில் "லுணுகல பேசம்வல" எனும் பெயரில் சுற்றுலாத் துறையின் கவனத்தை ஈட்டிக்கொண்டுள்ள பிரதேச மொன்று இருக்கின்றதென்பதையும்;

(ii) மேற்படி இடமும் அவ்விடத்தைச் சுற்றி அமைந் துள்ள பிரதேசமும் பாரிய சூழல் மாசடைதலுக்கு உள்ளாகியுள்ளதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) மேற்படி இடத்தில் நடைபெறும் சுற்றாடல் மாசடைதலை குறைப்பதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கை யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development and Youth Affairs:

(a) Is he aware that-

(i) there is a place of tourist attraction known as “Lunugala Besamwala” in Badulla District; and

(ii) that place and its environment have been affected by severe environmental pollution?

(b) Will he inform this House of the steps the Ministry intends to take to minimize environmental pollution taking place at that place?

(c) If not, why?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) මෙම ප්‍රදේශයට දේශීය හා විදේශීය සංචාරකයන් විශාල වශයෙන් පැමිණෙන අතර, ඔවුන් බැහැර කරන අපද්‍රව්‍යවලින් අවට පරිසරයට හානි සිදු වන බවත්, ඒ නිසා පාරිසරික ගැටලු රැසක් මතු වී ඇති බවත් මධ්‍යම පරිසර අධිකාරිය විසින් වාර්තා කර ඇත.

(ආ) බේසම්වල නම් ප්‍රදේශය සංචාරය සඳහා සුදුසු ස්ථානයක් වශයෙන් දියුණු කළ හැකි බැවින්, එම ස්ථානය තිරසරව භාවිතය සහ සංරක්ෂණය සඳහා පහත යෝජනා ක්‍රියාත්මකකොට සංචාරක ආකර්ෂණය දිනා ගැනීමටත්, ආරක්ෂිතව නැරඹීම සඳහා සංවර්ධනය කිරීමටත්, අවිධිමත් කසළ බැහැර කිරීම අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් අවශ්‍ය පියවර ගන්නා ලෙස ලුණුගල ප්‍රාදේශීය

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

සභාවට සහ ඌව පළාත් සංචාරක අමාත්‍යාංශයට දන්වා යැවීමට මධ්‍යම පරිසර අධිකාරිය විසින් කටයුතු කර ඇත.

යෝජනා

බේසම්වල නාන ස්ථානයට ළඟා වීම සඳහා ආරක්ෂිත ගමන් මාර්ගයක් සකස් කිරීම.

මෙම ස්ථානය කසළින් තොර ස්ථානයක් ලෙස පවත්වාගෙන යෑමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

මෙම ස්ථානයේ මද්‍යසාර භාවිතය සම්පූර්ණයෙන්ම වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

ඉහත ක්‍රියාමාර්ග ගැනීම සඳහා තාවකාලික මුර කුටියක් මෙම ස්ථානයේ ස්ථාපිත කිරීමටත්, බේසම්වල නැරඹීමට පැමිණෙන සංචාරකයන්ට අවශ්‍ය උපදෙස් මාලාව ඒ ස්ථානයේ ප්‍රදර්ශනය කිරීම.

මෙම ක්‍රියාමාර්ග ගනිමින් පරිසර දූෂණය අවම කිරීමට කටයුතු කිරීම ලුණුගල ප්‍රාදේශීය සභාව සතු වගකීමක් වේ.

(ඈ) පැන නොනඟී.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, පිළිතුරු ලබා දීම ගැන ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා. "බේසම්වල" ලුණුගල ප්‍රදේශයේ තිබෙන ස්ථානයක්. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මම පැහැදිලිවම දන්නවා, නිලධාරින්ට මේ උත්තරය තමයි එවන්න සිද්ධ වන්නේ කියලා. මොකද, ඒකට හේතුවක් තිබෙනවා. මා කියන ස්ථානයට අදාළ පිළිතුර ඒ අයට එවන්න බැහැ. ඒකට හේතුව මා කියන්නම්. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, 2017.10.23 දින මා විසින් යවන ලද ලිපියට මධ්‍යම පරිසර අධිකාරිය විසින් එවන ලද UPO/BD/07/02/18/17 දරන ලිපිය කෙරෙහි. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මධ්‍යම පරිසර අධිකාරිය නිකුත් කළ මේ ලිපියේ සඳහන් වන්නේ, දීලා තිබෙන පරිසර බලපත්‍රයක් අවලංගු කිරීම ගැනයි. මේ කියන ජල රක්ෂිතයේ සහ ඒ සුන්දර ප්‍රදේශය තුළ ගල් crusher එකක් තිබෙනවා. නමුත්, මේ ප්‍රශ්නයට පිළිතුර වශයෙන් සඳහන් කර තිබෙන්නේ, වෙනත් කාරණයක්. විය යුත්තේ, මෙන්න මේ ලිපියට අනුව කටයුතු කරන එකයි. එය අයින් කරන්න කියලා තමයි මධ්‍යම පරිසර අධිකාරිය කියලා තිබෙන්නේ. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි. එය ඉවත් කළ යුතුයි, ඒක අනවසර එකක්, ඒක නීත්‍යනුකූල නැහැ කියලා අදාළ ප්‍රාදේශීය සභාවෙන් ද ලිපියක් නිකුත් කර තිබෙනවා. ඒ වාගේම, එය මාර්ග රක්ෂිතයකයි හදා තිබෙන්නේ. එය, පළාත් සභා පාරක්; PRDA පාරක්. PRDA එකේ අධ්‍යක්ෂවරයා ලියුමක් යවනවා. ඒ තමයි, එය වහාම ඉවත් කර ගන්න කියන ලියුම. මෙය දීර්ඝ කාලීනව තිබෙන ප්‍රශ්නයක්. ඒ ගල් වළ තිබීම මහා විශාල පාරිසරික ගැටලුවක්. මධ්‍යම පරිසර අධිකාරිය දුන් බලපත්‍රය ඔවුන් අවලංගු කරගන්නවා. ඒ වාගේම, ප්‍රාදේශීය ලේකම් ලියන ලිපියකුත් තිබෙනවා. මේ සියලු නිලධාරින් අතර නීත්‍යනුකූලව ලිපි හුවමාරු කළාට ඒ ගල් crusher එක අයින් කර ගැනීම සඳහා තවම කටයුතු කරලා නැහැ. ඒ ගල් crusher එක යොදාගෙන අදටත් ගල් කඩනවා.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මධ්‍යම පරිසර අධිකාරියේ ඒ නිලධාරින් තමන්ගේ රාජකාරිය හරියාකාරව ඉෂ්ට සිද්ධ කළත් පරිසර අමාත්‍යාංශයේ ඇමතිවරයා -ඔබතුමා රාජ්‍ය ඇමතිවරයා- දේශපාලන වශයෙන් එයට ව්‍යංගයෙන් අවසර ලබා දීලා තිබෙනවා. ඒක වෙනත් කාගේවත් නොවෙයි, ඌව පළාතේ ප්‍රධාන ඇමතිතුමාගේ ගල් crusher එක.

මේ ආයතන සියල්ලෙන්ම මේ ගල් වළ අවලංගු කරන්න කියලා ලිපි හුවමාරු වුණත්, පරිසරයට හානි කරන විධියට, සුන්දර ප්‍රදේශවලට හානි කරන විධියට, ජල රක්ෂිතවලට හානි කරන විධියට අදටත්, දැනටත්, හෙටටත් මේ crusher එක තියේවි. මම අහන්නේ, ඔබ අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ දැනුවත්කම නිසා මේ නිලධාරින්ට මේ ගල් වළ අයින් කරන්න බැරි වෙලා තිබෙනවා කියන කාරණය ඔබතුමා පිළිගන්නවාද කියලායි.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා බදුල්ල ප්‍රදේශය ගැන, ඒ දිස්ත්‍රික්කය ගැන අවධානය යොමු කරලා පරිසරය ගැන සොයා බැලීම පිළිබඳව විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම කනගාටුවෙන් කියන්න ඕනෑ, මේ ප්‍රශ්නයේ කොතැනකවත් crusher එකක් ගැන සඳහන් වෙලා නැති බව. "සංචාරක අවධානය දිනා ගත් ප්‍රදේශයක් තිබෙන බවත්, එම ප්‍රදේශය පරිසර දූෂණයට ලක්වී ඇති බවත්, එම දූෂණය අවම කිරීමට අමාත්‍යාංශය ගන්නා පියවර මොනවාද?" කියලායි මේ ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ. ඔබතුමා කියපු මේ crusher එක ගැන මේ ප්‍රශ්නයේ සඳහන් නොවීමත්, අපට ඒ ගැන අවධානය යොමුනොකරවීම ගැනත් කනගාටුව ප්‍රකාශ කරනවා. මේ ප්‍රශ්නයේ කොතැනකවත් crusher එකක් ගැන සඳහන් කරලා නැහැ; සංචාරක ව්‍යාපාරය ගැනයි සඳහන් වෙන්නේ. නමුත්, ඔබතුමා කියන්නේ ඇත්ත. ඔබතුමා ඒ ප්‍රදේශයේ ජීවත් වෙන මන්ත්‍රීවරයානේ. එම නිසා ඒ crusher එක ගැන වෙනම සොයා බැලීම සඳහා කටයුතු කරලා, ඔබතුමාට අවශ්‍ය පිළිතුර මම ලබා දෙන්නම්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ඔබතුමා කියන දේ කරන ඇමතිවරයෙක්. වගකීම් සම්භාරයක් ඉටු කරන ඇමතිවරයකු හැටියට ඔබතුමා කියන දේ මම විශ්වාස කරනවා. මම ඔබතුමාට ඉදිරිපත් කරන්නම්, මේ ගල් වළ අවලංගු කරන්න කියලා මධ්‍යම පරිසර අධිකාරියෙන්, ප්‍රාදේශීය සභාවෙන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්, පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලේකම්වරයා සහ අධ්‍යක්ෂවරයා එවා තිබෙන ලියුම්. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඇත්තටම මේ නිලධාරින් පව්. මොකද, එතුමන්ලා විශාල කාර්යභාරයක් කරනවා. මේ සම්බන්ධව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා වූ ලිපි පවා මා ළඟ තිබෙනවා. මම ඒවාත් ඔබතුමාට දෙන්නම්. මම මේ පිළිබඳව නොබෝ දිනකින් නැවත තවත් ප්‍රශ්නයක් අහනවා. මේ ගැන සොයා බලා මම මේ කියන කාරණය ඇත්තක් නම්, ඔබතුමා කොච්චර කාලයක් ගන්නවාද මේ ගල් වළ නවත්වන්න? මධ්‍යම පරිසර අධිකාරියේ නියෝගයකට පිටු පාලා, ඒ නියෝගය ක්‍රියාත්මක නොකර දැන් අවුරුදු දෙකක් විතර ගත වෙලා තිබෙනවා. දැන් ඔබතුමා කියනවා, මේ ගැන සොයා බලා නවත්වනවා කියලා. ඔබතුමා කියන මේ සියලු දේ සත්‍යය නම්, ඔබතුමාට කොච්චර කාලයකින් ඒක නතර කිරීමේ හැකියාවක් තිබෙනවාද?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මාසයක් ඇතුළත කියලා කියන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ඔබතුමා ඒ ගමේ එක්කෙනා. ඔබතුමා නිවැරදියි. නමුත්, මේ ප්‍රශ්නයේ සඳහන් වෙලා තිබෙන්නේ සංචාරක ව්‍යාපාරයක් ගැන. ඒකයි මට crusher එකක් ගැන හිතන්න බැරි වෙලා තිබෙන්නේ. මේක සංචාරක ප්‍රදේශයක්. සංචාරක ව්‍යාපාරයට බලපාන පාරිසරික ගැටලු පිළිබඳ තමයි ප්‍රශ්නයේ සඳහන් වෙලා

තිබෙන්නේ. නමුත් ඔබතුමා මේ නඟන ප්‍රශ්නය crusher එකක ප්‍රශ්නයක් නම්, අනිවාර්යයෙන්ම මම ඔබතුමා වෙනුවෙන් ඒ කටයුත්ත කරනවා. ඒ ගැන හොයා බලා මම ඔබතුමාට වාර්තා කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, සොයා බලා ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග ගන්න.

## මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට වෙන් කළ ප්‍රතිපාදන: විස්තර
### மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் அமைச்சுக்கு ஒதுக்கப்பட்ட நிதி: விபரம்
### ALLOCATIONS FOR MINISTRY OF MAHAWELI DEVELOPMENT AND ENVIRONMENT: DETAILS

206/'18

**3. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2017 වර්ෂය සඳහා විසර්ජන පනත මඟින්, පරිපූරක ඇස්තමේන්තු මඟින් හා වෙනත් අතිරේක ප්‍රතිපාදන මඟින් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2017 වර්ෂය තුළ එම අමාත්‍යාංශය මඟින් වියදම් කළ මුළු මුදල කොපමණද;

(iii) එය වෙන් කළ මුළු ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) ඉතිරි වූ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(v) එය වෙන් කළ මුළු ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு மாகாண அபிவிருத்தி மற்றும் இளைஞர் அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2017 ஆம் ஆண்டுக்கான ஒதுக்கீட்டுச் சட்டம் மூலம் மீள்நிரப்பு மதிப்பீடுகள் மற்றும் வேறு மேலதிக நிதி ஒதுக்கங்கள் மூலம் மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் அமைச்சுக்கு ஒதுக்கப்பட்ட நிதி ஒதுக்கங்களிலிருந்து வெவ் வேறாக யாவை;

(ii) 2017 ஆம் ஆண்டு அந்த அமைச்சினால் செலவிடப்பட்ட மொத்தத் தொகை எவ்வளவு;

(iii) இது ஒதுக்கப்பட்ட மொத்த நிதி ஒதுக்கங் களிலிருந்து எத்தனை வீதம்;

(iv) மீதியாகவுள்ள நிதி ஏற்பாடுகள் எவ்வளவு;

(v) இது ஒதுக்கப்பட்ட மொத்த நிதி ஒதுக்கங்களி லிருந்து எத்தனை வீதம்;

என்பதை அவர் இச் சபையில் அறிவிப்பாரா ?

(ஆ) இன்றேல் ஏன்?

asked the Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development and Youth Affairs:

(a) Will he inform this House -

(i) separately, the financial allocations made for the Ministry of Mahaweli Development and Environment pertaining to the year 2017 by way of the Appropriation Act, Supplementary Estimates and the other additional provisions;

(ii) the total amount of money spent by the aforesaid Ministry in year 2017;

(iii) the percentage of aforesaid sum as against the total allocations made;

(iv) the balance amount of financial allocations; and

(v) the percentage of aforesaid sum as against the total allocations made?

(b) If not, why?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2017 වර්ෂය සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත වෙන් කළ ප්‍රතිපාදන පහත පරිදි වේ.

විසර්ජන පනත මඟින් වෙන් කළ ප්‍රතිපාදන රු. 49,097,766,000.00

අතිරේක ප්‍රතිපාදන රු. 266,781,825.00

(ii) 2017 වර්ෂය තුළ අමාත්‍යාංශය මඟින් වියදම් කළ මුළු මුදල රුපියල් 38,070,147,440.00

(iii) වෙන් කළ මුළු ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස 77%

(iv) ඉතිරි වූ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය රු. 11,294,400,385.00

(v) වෙන් කළ මුළු ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස 23% කි.

(ආ) පැන නොනඟී.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මගේ පළමු අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මගේ මේ ප්‍රශ්නය ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයට සෘජුව අයිති නැති වුණාට, මෙම ප්‍රශ්නය පරිසරයට සම්බන්ධ බරපතළ ප්‍රශ්නයක්.

ඔබතුමා දන්නවා, කෙරවලපිටියේ කුණු ගොඩ ගැහිලා, ගොඩ ගැහිලා නිසා, එතැනින් එහාට කුණු භාර ගන්න එක නතර කරලා තිබෙන බව. ඒ නිසා දැන් කොළඹ කුණු එකතු කරන්නේ නැහැ. කුණු ප්‍රශ්නය මේ විධියට විටින් විට මතු වෙනවා. තමුන්නාන්සේලාත් "වඳුරෝ ගෙවල් හදනවා වාගේ" මොකක් හරි උත්තරයක් තමයි දෙන්නේ. මේ ප්‍රශ්නයට, අද කෙරවලපිටියේ මතුවෙලා තිබෙන මේ ප්‍රශ්නයට ලබා දෙන විසඳුම කුමක්ද කියන එක මම දැන ගන්න කැමැතියි.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අපි "වඳුරෝ ගෙවල් හදනවා වාගේ" උත්තර දෙනවා. ඔබතුමා "කොහේද යන්නේ මල්ලේ පොල්" වාගේ අතුරු ප්‍රශ්න අහනවා. ඔබතුමා මට මේ ප්‍රශ්නය යොමු කරලා තිබෙන්නේ,-[බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නය යොමු කරලා තිබෙන්නේ අපේ අමාත්‍යාංශයේ 2018 වර්ෂයේ මුදල් වැය කිරීම සම්බන්ධවයි. නමුත්, කෙරවලපිටිය කසළ අංගනයේ වගකීම භාර අරගෙන තිබෙන්නේ Megapolis and Western Development අමාත්‍යාංශය. මේ වෙලාවේ ඒ ගරු ඇමතිතුමා ඉන්නවා. එතුමා ඒ ප්‍රශ්නයට උත්තර දෙයි. [බාධා කිරීමක්] නැහැ. ගරු මන්ත්‍රීතුමනි, එක් එක් අමාත්‍යාංශ විසින් වැඩ බෙදාගෙන තිබෙනවානේ. හොඳ වෙලාවට ඔබතුමාගේ ප්‍රශ්නයට උත්තර දෙන්න ගරු ඇමතිතුමා මේ සභාවේ ඉන්නවා. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු පාඨලී චම්පික රණවක අමාත්‍යතුමාට පිළිතුරු දෙන්න අවස්ථාව දෙමු.

**ගරු පාඨලී චම්පික රණවක මහතා (මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Megapolis and Western Development)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා විසින් පැන නඟුවේ ඉතා වැදගත් ප්‍රශ්නයක්. අපි කවුරුත් දන්නවා, මීතොටමුල්ලේ ඇති වූ ඛේදවාචකය. ඒ සිද්ධියෙන් පස්සේ කොළඹ කසළ දැමීමට ස්ථානයක් නැති වුණා. ඒ අවස්ථාවේ මාස දෙකක්, තුනක් යන තුරු තැන් තැන්වලට කසළ ගෙනිහින් දැම්මා. නමුත්, මහජන විරෝධතා නිසා අවසානයේ කොළඹ නගරයේ ස්ථාන ගණනාවක කසළ අතිවිශාල ප්‍රමාණයක් -ටොන් 6,000කට අධික ප්‍රමාණයක්- ගොඩ ගැහිලා, ඩෙංගු උවදුර ඇතිවෙලා, කොළඹ නගර සභාවටවත්, පළාත් සභාවටවත්, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයටවත් ඒ ප්‍රශ්නය විසඳාගන්න බැරි වුණා. එම නිසා එහි වගකීම 2017 ජූලි මාසයේ 7වැනි දා අපට තාවකාලිකව පැවරුණා.

ඒ අනුව ස්ථාවර විසඳුමක් ලැබෙන තෙක් අපේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට අයිති කෙරවලපිටියේ පිහිටි ස්ථානයක් අපි තාවකාලිකව හඳාගත්තා, වසරකට කසළ දැමීම සඳහා. අපි එම ස්ථානය ක්‍රම ක්‍රමයෙන් දියුණු කරලා වෙන් කරන ලද කසළ අරගෙන, දිරායන කසළවලින් කොම්පෝස්ට් හදන්නත්, නොදිරන කසළවලින් යම් ප්‍රමාණයක් ප්‍රතිචක්‍රීකරණය කරන්නත්, එසේ නොකරන කසළ තැන්පත් කරන්නත් වශයෙන් වන ක්‍රියාවලියක් වසරක කාලයකට භාර ගත්තා. මේ වන විට වසර දෙකකටත් අධික කාලයක් ගත වී තිබෙන බැවින්, ඒ ස්ථානයේ ධාරිතාව ඉක්මවා ගිහින් තිබෙනවා. ඒ නිසා පරිසරයට ප්‍රශ්න පැන නැඟී තිබෙන විත්තිය මධ්‍යම පරිසර අධිකාරියෙන් අපට දැනුම් දී තිබෙනවා. එම නිසා පසුගිය වසරේ සැප්තැම්බර් මාසයේ දී අපි කොළඹ නගර සභාවට දැනුම් දුන්නා, විකල්ප ස්ථානයක් සොයා ගන්න කියලා. ව්‍යාපෘති දෙකක් එනවා කියලා දැනුම් දුන්නා. කෙරවලපිටියේම කසළවලින් විදුලිය නිපදවන ව්‍යාපෘතියක් නිර්මාණය වෙනවා, ඒක මේ වසරේ නොවැම්බර් මාසයේ ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම, අරුවක්කාලු කසළ රඳවනයේ පළමුවැනි පියවර අවසන් වෙනවා කියලා අපි දැනුම් දුන්නා. නමුත් ඒ සම්බන්ධයෙන් කොළඹ නගර සභාවෙන් අපට සක්‍රිය පිළිතුරක් ලැබුණේ නැහැ. 2019 -මේ වසරේ- මාර්තු මාසයේ 16වැනි දින සිට අරුවක්කාලු ප්‍රදේශයේ සකස් කර තිබෙන කසළ අංගනයේ පළමුවැනි පියවරට කසළ ටොන් 600ක් භාර ගත හැකි බව අපි ඒ ගොල්ලන්ට දැනුම් දුන්නා. මේ පිළිබඳ විටින් විට දැනුම් දුන්නත්, ප්‍රතිචාරයක් ලැබිලා නැහැ. අවසානයේ අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ගරු වජිර අබේවර්ධන මැතිතුමාගේ මූලිකත්වයෙන් මේ පිළිබඳ හමුවක් පවත්වා, අපි ඒ ගැන පියවර ගත්තා. අපි අවශ්‍ය පරිසර අවසරය සහ අවශ්‍ය අනෙකුත් දේවල් ඔක්කොම අවසර අරගෙනයි තිබෙන්නේ. කොළඹ නගර සභාව කසළ භාර දීම සඳහා පළාත් සභාවත් සමඟ යම් එකඟතාවලට ඇවිත් තිබෙනවා. ඒවා විධිමත්ව භාර ගන්න අපි සූදානම්.

කෙරවලපිටියේ තවදුරටත් කසළ රඳවන්න බැහැ. මොකද, එහි ධාරිතාව ඉක්මවා ගොස්, ඒ ප්‍රදේශයට බලගතු පාරිසරික ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ නිසා කොළඹ නගර සභාව දැන් කළ යුත්තේ, අපි විධිමත්ව හදලා තිබෙන අරුවක්කාලු කසළ අංගණයට කසළ ගෙනැවිත් භාර දීමයි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය, මේ වෙලාවේ තිබෙන ඉතාම බරපතළ ප්‍රශ්නයක් ගැනයි. පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමාත් මේ අවස්ථාවේ සභාවේ සිටින නිසායි මා මෙය අහන්නේ.

ගරු ඇමතිතුමනි, කොළඹ නගර සභා සීමාව තුළ තිබෙන කුණුවලට මේ දවස් කිහිපය තුළ ඔබතුමන්ලා මොකක්ද කරන්න හදන්නේ? අඩු තරමින් පරිසර ඇමතිතුමා උත්තර දෙන්නේ නැත්නම්, ඔබතුමාවත් ඒකට උත්තරයක් දෙන්න .

**ගරු වජිර අබේවර්ධන මහතා (අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
The Hon. Wajira Abeywardana - (Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මාත්, ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමාත් අවධානය යොමු කර

තිබෙනවා. වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ගිය සතියේ දිනක රාත්‍රියේ ගෙන්වා සාකච්ඡා කළා. ඒ සාකච්ඡාවෙන් පස්සේ වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඉල්ලීමක් කරනවා, මේ කසළ රඳවනය හැසිරවීම සහ අනෙකුත් කටයුතු සම්බන්ධයෙන් මාසයකට රුපියල් මිලියන 3 බැගින් දීමනාවක් දෙන්න කියලා. ඒ ගැන අද දවල් වරුවේ සාකච්ඡාවක් කළා. කොළඹ නගර සභාවත්, වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවත් එකඟතාවකට පැමිණ මේ දින කිහිපය ඇතුළත මේ ප්‍රශ්නය ඉක්මනින්ම නිරාකරණය කරන්න බලනවා.

## ජීව විද්‍යාව විෂය නව නිර්දේශය: ගැටලු
## உயிரியல் துறைக்கான புதிய பாடத்திட்டம்: பிரச்சினை
## NEW SYLLABUS FOR BIOSCIENCE : ISSUES

319/'18

**4. ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2019 වර්ෂයේදී ජීව විද්‍යා විෂය ධාරාවෙන් අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටීමට නියමිත සිසුන්ට නව විෂය නිර්දේශයක් හඳුන්වා දී ඇති බවත්;

(ii) වසරක් ගත වී ඇතත්, මේ වනතෙක් ලබා දී ඇත්තේ ඒකක 5ක විෂය නිර්දේශයක් පමණක් බවත්;

(iii) ඒවා ද ලබාදී ඇත්තේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් බවත්;

(iv) නව විෂය නිර්දේශය සඳහා ප්‍රායෝගික පරීක්ෂණ හා ගුරු අත්පොත් ලබාදී නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) එම විෂය නිර්දේශය හඳුන්වා දෙන විට ගුරුවරුන්ට ගුරු පුහුණුව හා නව නිර්දේශය පිළිබඳ දැනුවත් කිරීමක් සිදු කරනු ලැබුවේද;

(ii) සම්පූර්ණ විෂය නිර්දේශය ලබා දීමට කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2019 ஆம் ஆண்டு உயிரியல் பாடத் துறையில் க.பொ.த.(உயர் தரம்) பரீட்சைக்குத் தோற்ற வுள்ள மாணவர்களுக்கு புதிய பாடத்திட்ட மொன்று அறிமுகப்படுத்தப்பட்டுள்ளதென்ப தையும்;

(ii) ஒரு வருட காலம் கடந்துள்ளபோதிலும் இது வரை 5 அலகுகளைக் கொண்ட பாடத்திட்டம் மட்டுமே வழங்கப்பட்டுள்ளதென்பதையும்;

(iii) அவைகூட ஆங்கில மொழியில் மட்டுமே வழங்கப்பட்டுள்ளதென்பதையும்;

(iv) புதிய பாடத்திட்டத்திற்காக நடைமுறைப் பரிசோதனைகள் மற்றும் ஆசிரியர் கையேடுகள் வழங்கப்படவில்லையென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி பாடத்திட்டம் அறிமுகப்படுத்தப்படும் போது ஆசிரியர்களுக்கு ஆசிரியர் பயிற்சி மற்றும் புதிய பாடத்திட்டம் பற்றிய விழிப் பூட்டல் வழங்கப்பட்டதா என்பதையும்;

(ii) முழுப் பாடத்திட்டத்தையும் பெற்றுக் கொடுப் பதற்கு நடவடிக்கை எடுக்கப்படும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல் ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that-

(i) a new syllabus has been introduced to the students who are to sit for the GCE (Advanced Level) Examination in the Bioscience stream in the year 2019;

(ii) they have been provided with a syllabus containing only five units even after a lapse of one year;

(iii) those units too have been prepared only in the English language; and

(iv) guidance on practical tests and teachers' guides have not hitherto been provided for new syllabus?

(b) Will he inform this House-

(i) whether training and awareness sessions on the new syllabus were conducted for the teachers when it was introduced; and

(ii) the date on which action will be taken to provide the complete syllabus?

(c) If not, why?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2019 වසරේ දී ජීව විද්‍යා විෂය ධාරාවෙන් අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටීමට නියමිත සිසුන්ට 2017 වසරේ සිට නව විෂය නිර්දේශය හඳුන්වා දී ඇත.

(ii) එම විෂය නිර්දේශයට ඒකක 10ක් ඇතුළත් වන අතර, එම සියලු ඒකක ඇතුළත් විෂය නිර්දේශ ජීව විද්‍යා ගුරුවරුන්ට මාධ්‍ය තුනෙන්ම ලබා දී ඇත.

(iii) අ.පො.ස. (උ.පෙළ) ජීව විද්‍යාව 2017 වසරේ සිට ක්‍රියාත්මක වන නව විෂය නිර්දේශයේ පිටපත් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය තුනෙන් ම ලබා දී ඇත.

(iv) නව විෂය නිර්දේශය සඳහා නිර්දේශිත, ප්‍රායෝගික පරීක්ෂණ විෂය නිර්දේශයේ අදාළ නිපුණතා මට්ටම් යටතේ තද කළු අකුරින් මුද්‍රණය කර ඇත.

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

12 ශ්‍රේණිය - ගුරු මාර්ගෝපදේශය

- නව විෂය නිර්දේශයට අදාළ ඉංග්‍රීසි මාධ්‍ය ගුරු මාර්ගෝපදේශයේ පිටපත 2017 වසරේ අගෝස්තු මස 03 දින සිට සැප්තැම්බර් මස 03 දින දක්වා පැවැති ගුරු පුහුණු වැඩමුළුවලදී ගුරුවරුන්ට ලබා දී ඇත.
- ගුරු මාර්ගෝපදේශයේ සිංහල හා දෙමළ මාධ්‍ය පිටපත් 2018 පෙබරවාරි මස අවසන් සතියේ විද්‍යා විෂය ධාරාව උගන්වන සියලු පාසල්වලට බෙදා හැර ඇත.
- ඒ අනුව ගුරු මාර්ගෝපදේශයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය පිටපත් මේ වන විට බෙදා හැර ඇති අතර, එම පිටපත් භාෂා තුනෙන්ම ජාතික අධ්‍යාපන ආයතනයේ වෙබ් අඩවියේ පළ කර ඇත.

13 ශ්‍රේණිය - ගුරු මාර්ගෝපදේශය

- සිංහල හා දෙමළ ගුරු මාර්ගෝපදේශය පිටපත් 2018 වසරේ ජූනි මස 11 සිට ජූලි මස 31 දින දක්වා පැවැති ගුරු පුහුණු වැඩමුළුවලදී ගුරුවරුන්ට ලබා දී ඇත.
- ගුරු මාර්ගෝපදේශයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය පිටපත් මේ වන විට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මඟින් මුද්‍රණය කර බෙදා හැර ඇති අතර, ජීව විද්‍යා නව විෂය නිර්දේශය හා 13 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය තුනෙන්ම ජාතික අධ්‍යාපන ආයතනයේ වෙබ් අඩවියේ පළ කර ඇත.

(ආ) (i) නව විෂය නිර්දේශය පිළිබඳ ජීව විද්‍යා ගුරුභවතුන් දැනුවත් කිරීම සඳහා 2017 සහ 2018 වසරවලදී වැඩසටහන් පවත්වා ඇත. එම වැඩසටහන් පහත ඇමුණුමෙහි දක්වා ඇත.

ඇමුණුම 01

- 2017 වසරේ දී 12 ශ්‍රේණිය සඳහා පැවැත් වූ පුහුණු වැඩමුළු

| දිනය | පළාත | සහභාගි වූ සංඛ්‍යාව | පැවැත්වූ ස්ථානය |
|---|---|---|---|
| 2017.08.03 | දකුණු පළාත | 200 | රුහුණු විශ්ව විද්‍යාලය |
| 2017.08.05 | බස්නාහිර පළාත, වයඹ පළාත, සබරගමුව පළාත | 515 | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, මහරගම |
| 2017.08.06 | මධ්‍යම පළාත, උතුරු මැද පළාත, ඌව පළාත | 315 | උසස් බාලිකා විද්‍යාලය, මහනුවර |
| 2017.08.05 | නැගෙනහිර පළාත | 210 | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, මහරගම |
| 2017.08.03 | උතුරු පළාත | 120 | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, මහරගම |

- 2018 වසරේදී 13 ශ්‍රේණිය සඳහා පැවැත්වූ පුහුණු වැඩමුළු

| දිනය | පළාත | සහභාගි වූ සංඛ්‍යාව | පැවැත් වූ ස්ථානය |
|---|---|---|---|
| 2018.06.11 | සබරගමුව පළාත, වයඹ පළාත | 226 | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, මහරගම |
| 2018.06.20 | බස්නාහිර පළාත | 304 | තර්ස්ටන් විද්‍යාලය, කොළඹ 07 |
| 2018.06.29 | දකුණු පළාත,උතුරු මැද පළාත | 193 | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, මහරගම |
| 2018.07.05 | මධ්‍යම පළාත, උතුරු / නැගෙනහිර පළාත, ඌව පළාත | 177 | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, මහරගම |
| 2018.07.06 | උතුරු පළාත (දෙමළ මාධ්‍ය) | 120 | හින්දු විද්‍යාලය, යාපනය |
| 2018.07.20 | නැගෙනහිර පළාත (දෙමළ මාධ්‍ය) | 86 | ශාන්ත මේරි විද්‍යාලය, ත්‍රිකුණාමලය |
| 2018.07.31 | උතුරු නැගෙනහිර හැර අනෙකුත් සියලු පළාත් (දෙමළ මාධ්‍ය) | 67 | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, මහරගම |

(ii) සම්පූර්ණ විෂය නිර්දේශය ඉහත (අ) කොටසෙහි දැක්වෙන පරිදි මේ වන විට ලබා දී ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

ගරු කථානායකතුමනි, උසස් පෙළ ජීව විද්‍යා ප්‍රශ්න පත්‍රය පිළිබඳ මේ ගැටලුව අප ඉදිරිපත් කළා. එම විෂය නිර්දේශයේ සමහර කොටස් සිංහල මාධ්‍ය සහ ද්‍රවිඩ මාධ්‍ය සිසුන්ට එම භාෂාවලින් දීලා නැහැ. ඒවා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණයි පළ කර තිබෙන්නේ.

අවාසනාවකට, අද තමයි උසස් පෙළ විභාගයේ ජීව විද්‍යාව ප්‍රශ්න පත්‍රයට සිසුන් මුහුණ දෙන්නේ. මීට මාසයකට පෙර, මේ ජීව විද්‍යා විෂය නිර්දේශයේ ගැටලු පිළිබඳව ගුරුවරු 357 දෙනෙක් දිවුරුම් ප්‍රකාශ සහිතව අධිකරණය ඉදිරියේ නඩුවක් පැවරුවා. ඒ ගුරුවරුන් පිරිස විශාල මුදලක් වියදම් කරලා තමයි ශ්‍රේෂ්ඨාධිකරණයේ ඒ නඩු පැවරුවේ; පෙත්සමක් ඉදිරිපත් කළේ. ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා කියන විධියට මේක සරල ප්‍රශ්නයක් නම් -මේ විෂය නිර්දේශයේ ගැටලු නොතිබුණා නම්- දෙමව්පියෝත්, ගුරුවරු 357 දෙනෙකුත් දිවුරුම් ප්‍රකාශ සහිතව නඩු පවරන්නේ නැහැ නේ. එහි පැහැදිලි ගැටලුවක් තිබුණු නිසා තමයි ඔවුන් අධිකරණයේ නඩු පැවරුවේ. ඔබතුමා ඒ පිළිබඳව දන්නවාද කියන එක තමයි පළමු වැනි අතුරු ප්‍රශ්නය ලෙස මම අහන්නේ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, අධිකරණයේ නඩු පැවරූ පමණින් ගැටලුවක් තිබේද කියන්න බැහැ. විෂය නිර්දේශ විටින් විට වෙනස් කරනවා. විශේෂයෙන්ම, අධ්‍යාපනය නවීකරණය වනකොට විෂය නිර්දේශ විටින් විට වෙනස් කරනවා.

යම් යම් ගුරුකුල තිබෙනවා. මට මේ කාරණය මතකයි, ගරු කථානායකතුමනි. 2015දී අපි බලයට එනකොට සමහර අය ගුරුකුල හදාගෙන හිටියා. පොත් ලියන්නේත් ඒ ගොල්ලෝ, විෂය නිර්දේශ හදන්නේත් ඒ ගොල්ලෝ. ඒ කටයුතු යාවත්කාලීන වෙන්න දෙන්නේ නැහැ. ටියුෂන් පන්තිවලට ඕනෑ විධියට ගොඩක් කටයුතු සිදු වුණා. හැබැයි, අපි ඒ විධියට කරන්නේ නැහැ. අපි විෂය නිර්දේශ වෙනස් කරනවා. දැන් ගොඩක් වෙලාවට ප්‍රශ්න හදන්නේ විෂය නිර්දේශයට අනුවයි. අපි විශ්වවිද්‍යාලයට ගිය කාලයේ නම් පසුගිය ප්‍රශ්න පත්‍ර පහක් විතර අරගෙන බැලුවාම, එන ප්‍රශ්න මොනවාද කියලා අපට තේරෙනවා. දැන් ඒ සියල්ල වෙනස් කරගෙනයි යන්නේ.

මේ විෂය සම්බන්ධයෙන් පමණක් නෙවෙයි, ජනමාධ්‍ය විෂය සම්බන්ධයෙනුත් ප්‍රශ්න ආවා. මහාචාර්යවරයකුගෙන් සැදුම්ලත් කමිටුවකින් ප්‍රශ්න පත්‍ර හදනකොට කලින් ප්‍රශ්න පත්‍ර හැදූ අය ඇවිල්ලා කියනවා, "මෙහෙම නොවෙයි අර විධියටයි එන්න ඕනෑ" කියලා. මේ වාගේ විවිධ මත සහ විවිධ ප්‍රශ්න තිබෙනවා. සමහර ගුරුවරුත් හිතනවා, "අපි හැම දාම උගන්වපු දේ උගන්වන එක ලෙහෙසියි, මේක අපට ගැටලු සහගතයි, ඒ නිසා කලින් ප්‍රශ්න පත්‍ර හදපු විධියටම තිබෙන්න ඕනෑ" කියලා. එවැනි ගැටලු තිබෙනවා, ගරු කථානායකතුමනි. ගරු මන්ත්‍රීතුමනි, ගුරු මාර්ගෝපදේශ දුන්නේ කවදාද, බෙදා හැරියේ කවදාද, ගුරුවරුන් පුහුණු කළේ කවදාද කියන දින වකවානු එක්ක අපි විස්තර දීලා තිබෙනවා. එහි යම් අඩු පාඩුවක් වෙලා තිබෙනවා නම්, මෙන්න මේ මේ පාසල්වලට මේ වනකොට හම්බ වෙලා නැහැ කියලා ඔබතුමා මට

ඒ පාසල්වල නමත් එක්ක විස්තර දෙන්න. එතකොට මම ඒ පිළිබඳව විමර්ශනයක් පවත්වා අවශ්‍ය පියවර ගන්නම්.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ජාතික පාසල්වල ගුරුවරු ඇතුළු සියලු රජයේ පාසල්වල ගුරුවරු ජීව විද්‍යා විෂය නිර්දේශයේ තිබෙන ගැටලු පිළිබඳව ඔබතුමාට ලිඛිතව කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ජීව විද්‍යා විෂය නිර්දේශයේ ගැටලුවක් තිබෙනවා, සිංහල මාධ්‍යයෙන් සමහර විෂය කොටස් ලබා දීලා නැහැ කියලා ඔබතුමාගේ අමාත්‍යාංශයේ සමහර නිලධාරින් පිළිගෙන තිබෙනවා. අද, උසස් පෙළ විභාගයේ ජීව විද්‍යාව - II ප්‍රශ්න පත්‍රයේ දවසයි. අප මේ ප්‍රශ්නය කීප වතාවක් අවධානයට යොමු කළත්, ඔබතුමා උත්තර දෙන්න උත්සාහ නොකළ නිසා තමයි දෙමව්පියෝත්, ගුරුවරුත් විශාල වියදමක් දරලා අධිකරණයේ නඩු පැවරුවේ.

ගරු කථානායකතුමනි, දැන් තිබෙන ප්‍රශ්නය, ජාතික අධ්‍යාපන ආයතනයේ ජීව විද්‍යා විෂයය උගන්වන සහ විෂය නිර්දේශය සකස් කරන ගුරුවරු ඒ අදාළ විෂය අධ්‍යයනය කරපු අය නොවන එකයි. ජාතික අධ්‍යාපන ආයතනය මේ විෂය මාලාව සකස් කිරීමට ඉදිරිපත් කරන ගුරුවරු අදාළ ක්ෂේත්‍රය පිළිබඳව දැනුවත් අය නොවෙයි. ඒ අය වෙනත් උපාධි ලබාගත් අය. ජීව විද්‍යාව පිළිබඳ විෂය නිර්දේශයේ තිබෙන වැරදි රාශියක් ගුරුවරු ලිඛිතව ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා දරුවන්ගේ මේ ප්‍රශ්නය ඔබතුමා මඟ හරින්න එපා. මෙය පැහැදිලි ගැටලුවක්. මේ විෂය නිර්දේශය පිළිබඳව පැහැදිලි ප්‍රශ්නයක් තිබෙනවා. ඉදිරි කාලයේදීවත් මෙය නිවැරදි කරන්න කියලා අපි ඔබතුමාගෙන් ඉතාම කාරුණිකව ඉල්ලනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිවරයා විධියට මා කිසි විටකත් මඟ හැර යන්න උත්සාහ කරන්නේ නැහැ. ඔබතුමන්ලා දන්නවා, ඕනෑ වෙලාවක අතුරු ප්‍රශ්නයක් ඇහුවත් මා උත්තර දෙන බව. විශේෂයෙන්ම, ජීව විද්‍යා විෂය පිළිබඳ ගැටලුව සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න මාස ගණනකට කලින් මා අදාළ නිලධාරින් කැඳෙව්වා. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය කැඳෙව්වා, එහි ශාස්ත්‍රීය සභාවේ සභාපතිතුමා කැඳෙව්වා, ඊට අමතරව ජීව විද්‍යා විෂය සකස් කරන අය සහ ඒ විෂය නිර්දේශයට අදාළ නිලධාරින් කැඳෙව්වා, අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරුන් ඇතුළු සියලු අය කැඳෙව්වා, විභාග කොමසාරිස්වරයාත් කැඳෙව්වා. ඔවුන් කැඳවා පැය තුනකට, හතරකට වැඩි කාලයක් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළා. ඔබතුමා කියපු දේ මාධ්‍යවලත් ප්‍රචාරය වූ නිසා මගේ මාධ්‍යවේදියාටත් එන්න කියලා, මෙහෙම විවේචන තිබෙනවා, මේවාට පිළිතුරු දෙන්න කිව්වා. මාධ්‍යවල ප්‍රචාරය වූ කාරණා සහ ඔබතුමන්ලා කියන කාරණා ඇත්ත නොවෙයි කියලා ඒ සාකච්ඡාවේදී පැහැදිලි වුණා. ඇත්තටම යථාර්ථය ඒක නොවෙයි.

ඇත්ත වශයෙන්ම අපි එදාම ඒ ගැටලුව විසඳුවා. විසඳලා ඒ සඳහා අවශ්‍ය පියවර ගත්තා. මේ වෙනස්කම් කරගෙන යන්න ඕනෑ. සමහර ගුරුවරු මේවාට කැමැති නැහැ. අලුත් වෙනස්කම් කරනවාට, නවීකරණය කරනවාට කැමැති නැහැ. නමුත් අපට ඒ ස්ථාවරයේ ඉන්න පුළුවන්කමක් නැහැ. මොකද, ඉක්මනින් දැනුම වෙනස් වෙන නිසා. ගරු කථානායකතුමනි, 1900 වෙද්දී දැනුම දෙගුණයකින් වෙනස් වෙන්න අවුරුදු 100ක් ගත වුණා. 1945 දෙවන ලෝක යුද්ධය වෙද්දී, දැනුම දෙගුණයකින් වෙනස් වෙන්න ගත වුණේ අවුරුදු 25යි. අද තාක්ෂණයත් එක්ක නවීන ලෝකයට යනකොට දැනුම දෙගුණයක් වෙන්න ගත වෙන්නේ මාස දහතුනයි. අපි විශ්වවිද්‍යාලයට ගිය කාලයේ පරණ note එකක් තියාගෙන ඒක දිය වෙනතුරු උගන්වනවා. නමුත් අද ජීව විද්‍යාව විෂයයේ ඉඳලා ඔක්කෝම වෙනස් වෙන්න ඕනෑ.

අපි මේ ශාස්ත්‍රීය සභාවේ සභාපතිවරයා විධියට පත් කරලා තිබෙන්නේ ජයදේව උයන්ගොඩ මහත්මයා. එතුමා මහාචාර්යවරයෙක්. එතුමා එක්සත් ජාතික පක්ෂයේ කෙනෙක් නොවෙයි. අපි එහෙම අය නොවෙයි පත් කරලා තිබෙන්නේ. අපි හිතුවේ අලුත් විධියට හිතන, හොඳ, කවුරුත් පිළිගන්නා, අපි බලාපොරොත්තු වන ආකාරයට, අධ්‍යාපනයේ වෙනස්කම් කරන්නට පුළුවන් කෙනෙක් ශාස්ත්‍රීය සභාවේ සභාපතිවරයා කරන්නයි. අපි ඒ සඳහා ජයදේව උයන්ගොඩ මැතිතුමා පත් කළා. ගරු කථානායකතුමනි, අපි එදා එතුමාත් කැඳෙව්වා. ඒ අනුව, මේ විෂය සම්බන්ධයෙන් වූ ඒ ගැටලුව නිරාකරණය කරලායි තිබෙන්නේ. ට්‍යුෂන්වලට ඕනෑ ආකාරයට හෝ එහෙම නැත්නම් ගුරුවරුන්ට උගන්වන්න ලෙහෙසි වන ආකාරයට විෂය නිර්දේශය හදන්න අපට බැහැ. ගරු කථානායකතුමනි, මම අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් ඒ බව කියන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 - 428/'19 - (1), ගරු කනක හේරත් මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 - 480/'19 - (1), ගරු ජයන්ත සමරවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## පළාත් සභා මන්ත්‍රීවරු: වාහන ආනයන බලපත්‍ර
### மாகாண சபை உறுப்பினர்கள்: வாகன அனுமதிப்பத்திரம்
### PROVINCIAL COUNCILORS: VEHICLE PERMITS

510/'19

**7. ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දැනට ක්‍රියාත්මකව පවතින හා විසුරුවා හැර ඇති පළාත් සභාවල මන්ත්‍රීවරුන්ගෙන් කොටසකට සහනදායී බදු පදනම මත වාහන ආනයනය කිරීමට බලපත්‍ර ලබාදී ඇති බවත්;

(ii) එහෙත්, දැනට ක්‍රියාත්මකව පවතින හා විසුරුවා හැර ඇති පළාත් සභාවල ධුර දරන හා නොදරන මන්ත්‍රීවරුන්ගෙන් කොටසකට එම බදු සහන සහිත වාහන ආනයන බලපත්‍ර ලබා දීමට පියවර ගෙන නොමැති බවත්;

(iii) මෙතෙක් මන්ත්‍රී ධුර දරන හෝ නොදරන හෝ මන්ත්‍රීවරුන්ගෙන් ඇතැමෙකු වසර පහක අඛණ්ඩ ධුර කාලයක් දරා ඇති අතර එයින් වැඩි පිරිසක් මේ වන විට විසුරුවා හැර ඇති පළාත් සභාවල මන්ත්‍රීවරුන් බවත්;

එතුමා දන්නේද?

[ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා]

(ආ) (i) මේ අනුව, පළාත් සභා මන්ත්‍රීවරුන්ගෙන් කොටසකට සහනදායි බදු පදනම මත බලපත්‍ර ලබාදී තිබියදී, එම සුදුසුකම් සියල්ල සපුරා ඇති වෙනත් මන්ත්‍රීවරුන් පිරිසකට එම බලපත්‍ර ලබා නොදීම බරපතළ අසාධාරණයක් බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, එම වාහන ආනයන බලපත්‍ර මෙතෙක් හිමි නොවූ පළාත් සභා මන්ත්‍රීවරුන්ට එම බලපත්‍ර ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது இயங்குகின்ற மற்றும் கலைக்கப் பட்டுள்ள மாகாணசபை உறுப்பினர்களில் சிலருக்கு வரிச் சலுகை அடிப்படையிலான வாகனங்களை இறக்குமதி செய்ய அனுமதிப் பத்திரம் வழங்கப்பட்டுள்ளதென்பதையும்;

(ii) எனினும், தற்போது இயங்குகின்ற மற்றும் கலைக்கப்பட்டுள்ள மாகாண சபைகளின் பதவி வகிக்கின்ற மற்றும் பதவி வகிக்காத உறுப்பினர் களின் சிலருக்கு மேற்படி வரி சலுகையுள்ள வாகன இறக்குமதி அனுமதிப் பத்திரம் வழங்க நடவடிக்கை எடுக்கப்படவில்லை என்பதையும்;

(iii) இதுவரை பதவி வகிக்கின்ற அல்லது பதவி வகிக்காத உறுப்பினர்களில் சிலர் தொடர்ந்து ஐந்து வருட காலம் பதவி வகித்திருப்பதோடு அதில் அதிகமானவர்கள் தற்போது கலைக்கப் பட்டுள்ள மாகாண சபைகளின் உறுப்பினர்கள் ஆவர் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இதற்கமைய, மாகாண சபை உறுப்பினர்களின் ஒரு பகுதியினர் வரிச் சலுகை அடிப்படையிலான வாகன அனுமதிப்பத்திரம் பெற்றிருக்கையில் அவ்வனைத்து தகைமைகளையும் பூர்த்திச் செய்துள்ள வேறு உறுப்பினர் சிலருக்கு மேற்படி அனுமதிப்பத்திரம் வழங்கப்படாமை பாரிய அநீதி என்பதை ஏற்றுக்கொள்வாரா என்ப தையும்;

(ii) ஆமெனில், மேற்படி வாகன இறக்குமதி அனுமதி பத்திரம் இதுவரை கிடைக்கப்பெறாத மாகாண சபை உறுப்பினர்களுக்கு மேற்படி அனுமதி பத்திரங்களை வழங்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government:

(a) Is he aware that -

(i) permits have been provided to some of the councilors of the provincial councils which are currently operative or stand dissolved to import vehicles under concessionary tax basis;

(ii) however, measures have not been taken to provide such duty-free vehicle permits to some of the councilors who remain and do not remain as councilors of the provincial councils which are currently operative or stand dissolved; and

(iii) some of the councilors who currently serve or do not serve in the councils, have served as councilors continuously for a period of five years and that the majority of them are members of the provincial councils which currently stand dissolved?

(b) Will he inform this House -

(i) whether he admits that it is a grave injustice to deprive the concessionary duty-free vehicle permits to some of the councilors despite fulfilling all qualifications, when the same facility has been extended to some other councilors; and

(ii) whether action will be taken to provide the said vehicle permits to provincial councilors to whom they have hitherto not been provided?

(c) If not, why?

**ගරු වජිර අබේවර්ධන මහතා (අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்ளக, உள்நாட்டலு வல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
The Hon. Wajira Abeywardana - (Minister of Internal and Home Affairs and Provincial Councils and Local Government)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේ ය.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) ඔව්.

(ආ) (i) ගරු මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2016 අය වැය යෝජනා අනුව සියලු මෝටර් රථ ආනයන බලපත්‍ර නිකුත් කිරීම 2015.11.20 දින සිට නවතන ලද බැවින් පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා තීරුබදු සහන සහිත වාහන ආනයන බලපත්‍ර ලබා දීම සඳහා වූ පළාත් සභා හා පළාත් පාලන චක්‍රලේඛ අංක 01/2013 අවලංගු විය. එදිනෙන් පසුව එම චක්‍රලේඛය ප්‍රකාරව කිසිදු පළාත් සභා මන්ත්‍රීවරයකුට තීරු බදු සහන සහිත වාහන ලබා දී නැත.

(ii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

එකම කාලවකවානුවක පළාත් සභාවට තේරී පත් වූ මන්ත්‍රීවරුන් කොටසකට වාහන ආනයන බලපත්‍ර දීලා තිබෙනවා.

ඒ කාලසීමාව තුළම පත් වූ තවත් පිරිසකට වාහන ආනයන බලපත්‍ර දීලා නැහැ. ගරු ඇමතිතුමනි, මම මේ අසන ප්‍රශ්නය ඔබතුමන්ලාගේ පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් අදාළයි.

එකට පත් වූ අයගෙන් කොටසකට දෙනවා, කොටසකට දෙන්නේ නැහැ. ඒ නිසා තමුන්නාන්සේලා චක්‍රලේඛයක් අවලංගු කරලා තිබෙනවා නම්, කරුණාකරලා ඒක වලංගු කරන්න. මේක අසාධාරණයි. කොටසකට දීලා, කොටසකට නොදෙන එක අසාධාරණයි කියලා ඔබතුමා පිළිගන්නවා නේ? දිස්ත්‍රික් මැතිවරණයකින් එකම විධියට පත් වූ කොටසකට දීලා තිබෙනවා. අවුරුදු දෙකහමාරක් ධුර කාලය දරපු අයටත් දීලා තිබෙනවා. අවුරුදු දෙකහමාරක්!

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන කාරණයේ සත්‍යතාවක් තිබෙනවා. චක්‍රලේඛ අනුව යම් ගැටලුවක් පැන නැඟිලා තිබුණත්, දැනට මතු වී තිබෙන ප්‍රශ්නය සම්බන්ධයෙන් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් සිටිනවා. මොකද, සංඛ්‍යා ලේඛනයක එක් කරුණක් අපට තවම හරියට වාර්තා වෙලා නැහැ. මන්ත්‍රීවරු දෙදෙනෙකුට 11 වැනි මාසයේ 20දාට පසු නිකුත් කළාය කියනවා. නමුත්, අපට තවම ඒ කරුණ සනාථ කරගන්න බැරි වෙලා තිබෙනවා. එසේ සනාථ වෙනවා නම්, උතුරු නැඟෙනහිර ප්‍රදේශවල මන්ත්‍රීවරුන්ට වෙනම දීලා තිබෙන කාරණය පිළිගන්න වෙනවා, ඒක වැරදියි කියලා. මොකද, එක කණ්ඩායමකට පමණක් සැලකීම වැරදියි. මේ පිළිබඳව කැබිනට් පත්‍රිකාවක් සකස් කරමින් තිබෙනවා. එය ඉක්මනින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඇමතිතුමනි, ඇත්තෙන්ම ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අවධානය යොමු කර තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඇත්තටම උතුරු පළාත් සභාවේ මන්ත්‍රීවරුන් හැමෝටම වාහන බලපත්‍ර දුන්නා. ඇමතිතුමා ඒක පිළිගන්නවා. පසුගිය ආණ්ඩුවෙන් ගහපු චක්‍රලේඛයක් අනුව, ලංකාවේ හැම පළාත් සභාවකම අවුරුදු දෙකහමාරක ධුර කාලයක් දරපු අයට බලපත්‍ර දුන්නා. නමුත් දැන් අවුරුදු පහක් ධුරය දරපු අයට ඒක දීලා නැහැ. ඇත්තටම මේක සාධාරණ නැහැ, ගරු ඇමතිතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, එතුමා කිව්වානේ, ඒ ගැන කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරනවා කියලා.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

ගරු කථානායකතුමනි, ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමා කියන කාරණය ඇත්ත. දකුණු පළාත් සභාවේ -මම ඒ නම් කියන්න කැමැති නැහැ.- මන්ත්‍රීවරු දෙදෙනෙකුට 11 වැනි මාසයේ 20 වැනි දාට පසුව බලපත්‍ර නිකුත් කළාය කියලා වාර්තා වෙනවා. ඒ ලියකියවිලිත් මම ඉල්ලා තිබෙනවා. ඒ කාරණයත් අමුණලා කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා.

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

ගරු ඇමතිතුමා මැදිහත් වෙලා ඒ ගැන කටයුතු කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, ගරු මන්ත්‍රීතුමනි.

## බස්නාහිර පළාතේ කුඹුරු ඉඩම්: විස්තර
## மேல் மாகாண வயற் காணிகள்: விபரம்
## PADDY LANDS IN WESTERN PROVINCE: DETAILS

517/'19

**8. ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2018 වර්ෂයේ මුල් කන්නයේදී බස්නාහිර පළාතේ වගා කරන ලද මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය හෙක්ටෙයාර කොපමණද;

(ii) බස්නාහිර පළාතේ වගා නොකර පුරන් වූ කුඹුරු බිම් ප්‍රමාණය හෙක්ටෙයාර කොපමණද;

(iii) එම වගා නොකර පුරන් වූ කුඹුරුවලින් රටට අහිමි වන වී ප්‍රමාණය මෙට්‍රික්ටොන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වගා කරන ලද එහෙත් වගා හානි වූ කුඹුරු ප්‍රමාණය හෙක්ටෙයාර කොපමණද;

(ii) එම හානි නැවත වරක් ඇති නොවීමට/අවම කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) වගා හානිවීම හේතුවෙන් අසරණ වූ ගොවීන්ට හානිපූර්ණය ලබා දෙනු ලබන දිනය කවදාද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වගා නොකරන කුඹුරු වෙනත් ආර්ථික කටයුත්තකට යෙදවීමට අවසර ලබා දෙන්නේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර තිබේද;

(iii) එම අධ්‍යයනයේ අන්තර්ගතය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2018 ஆம் ஆண்டின் முதலாவது போகத்தின் போது மேல் மாகாணத்தில் பயிர் செய்யப்பட்ட மொத்த வயற்காணிகளின் அளவு ஹெக்ரயார் களில் எவ்வளவு என்பதையும்;

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

(ii) மேல் மாகாணத்தில் பயிர் செய்யாது தரிசு நிலமாக உள்ள வயற் காணிகளின் அளவு ஹெக்ரயார்களில் எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி பயிர் செய்யப்படாத தரிசுநிலமாகவுள்ள வயல்களினால் நாடு இழந்துள்ள நெல் மெற்றிக் தொன்கள் எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) பயிர் செய்யப்பட்ட போதிலும் சேதமடைந்த வயலின் அளவு ஹெக்ரயார்களில் எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி சேதங்கள் மீண்டும் ஏற்படாதிருப் பதற்கு / குறைப்பதற்கு மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) பயிர்செய்கை சேதமடைந்ததன் காரணமாக அநாதரவாகியுள்ள கமக்காரர்களுக்கு இழப்பீடு வழங்கப்படும் திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) பயிர் செய்யப்படாத வயல்களை வேறு பொருளா தார நடவடிக்கைக்குப் பயன்படுத்திக் கொள்ள அங்கீகாரம் வழங்கப்படுமா என்பதையும்;

(ii) ஆமெனில், அது பற்றிய சாத்தியக்கூறுக் கற்கை மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(iii) மேற்படி கற்கையின் உள்ளடக்கம் யாது என்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Rural Economic Affairs, Irrigation and Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House -

(i) the total extent of paddy land in hectares cultivated in the Western Province during the first season of year 2018;

(ii) the total extent of fallow paddy land in hectares which remained without being cultivated in the Western Province; and

(iii) the number of metric tons of paddy yield lost to the country as a result of the abovementioned fallow paddy lands?

(b) Will he also inform this House -

(i) the number of hectares of paddy lands which were cultivated but were subjected to crop damage;

(ii) the action taken to ensure non recurrence / reduce of such crop damages; and

(iii) the date on which compensation will be paid to farmers who were rendered destitute as a result of crop damage?

(c) Will he further inform this House -

(i) whether permission is granted to use for other economic purposes, the paddy fields which are not used for cultivation;

(ii) if so, whether feasibility studies in this regard have been carried out; and

(iii) the contents of such feasibility studies?

(d) If not, why?

**ගරු පී. හැරිසන් මහතා (කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ஹரிசன் - கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Agriculture, Rural Economic Affairs, Irrigation and Fisheries and Aquatic Resources Development)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) හෙක්ටෙයාර 13,306.84.

(ii) හෙක්ටෙයාර 13,201.55.

(iii) පුරන් කුඹුරු වගා කළේ නම්, දළ වශයෙන් මෙට්‍රික්ටොන් 9,720ක අස්වැන්නක් ලැබිය හැකි බවට ඇස්තමේන්තු කර ඇත.

(ආ) (i) හෙක්ටෙයාර 1,108.94.

(ii) 1. කෘමි හානි / පළිබෝධ හානි අවම කර ගැනීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරින් හරහා ගොවි සංවිධාන වෙත යැවීම මඟින් ගොවීන් දැනුවත් කිරීම.

2. වගා හානි තර්ජනයේදී හානියේ ස්වභාවය අනුවකෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව එම හානි අවම කර ගැනීම සඳහා ඒකාබද්ධව කටයුතු කිරීම.

3. නියඟය හා ගංවතුර හානි වළක්වා ගැනීම සඳහා 2017, 2018 වසරවල වැව් අමුණු පිළිසකර කර ගැනීම තුළින් ජල සංරක්ෂණ සඳහා 2018 වසරේ මිලියන 133ක් වියදම් කර ව්‍යාපෘති 186ක්ද, 2017 වසරේ මිලියන 207ක්ද වියදම් කර ව්‍යාපෘති 266ක් නිම කර ඇත.

4. 2018 වසර තුළ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරින් හා ගොවි සංවිධාන දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක කර ඇත.

5. පුරන් කුඹුරු වගා කිරීම ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ 2017 වසරේ පුරන් කුඹුරු අක්කර 4,915ක්ද, 2018 වසරේ අක්කර 2,907ක්ද ලෙස බස්නාහිර පළාත තුළ සංවර්ධනය කර ඇති අතර, වාර්ෂිකව මෙම ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී.

(iii) 2018 යල කන්නයට අදාළ වන්දි මුදල් ගෙවීම සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන ලැබී ඇති බැවින් වගා හානි වූ ගොවීන් සඳහා වන්දි මුදල් නිදහස් කිරීම දැනටමත් ආරම්භ කර ඇති අතර, 2019.08.15වෙනි දින වන විට ගෙවීම අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව ගොවි පවුල් 1,913ක් සඳහා රුපියල් 26,911,899.00ක (දෙකෝටි හැටනවලක්ෂ එකළොස්දහස් අටසිය අනූනවයයි.) මුදලක් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) (i) කෘෂිකාර්මික කටයුත්තක් හැර වෙනත් ආර්ථික කටයුත්තක් සඳහා අවසර ලබා නොදෙන බව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වාර්තා කර ඇත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

පසුගිය රජය විසින් ගම්පහ දිස්ත්‍රික්කය ඇතුළත් වන බස්නාහිර පළාතත්, වයඹ පළාතත් ආවරණය කරගන්න පුළුවන් විධියට මරදගහමුල වී ගබඩාව සහ සහල් අළෙවි මධ්‍යස්ථාන ඉදිකරනු ලැබුවා. මෙපමණ විශාල අස්වැන්නක් ලැබී තිබියදී, මෙපමණ විශාල භූමි ප්‍රමාණයක වගා කටයුතු කෙරෙද්දී ඒ හදා තිබෙන සහල් ගබඩාව සහ ඒ අළෙවි සැල් මේ වනතෙක් විවෘත කරලා නැහැ. ඒ වැඩ කටයුත්ත ඔබතුමන්ලාගේ රජය අවුරුදු හතරක් පුරාවට කරලා නැහැ. ඒ වාගේම, මේ වනවිට මිලියන දහසක මුදලක් සමුපකාර ක්‍රමයක් යටතේ ඒ වී මෝල් හිමියන්ට වී මිලදී ගැනීම සඳහා මේ ආණ්ඩුව වෙන් කර තිබෙනවාය කියලා ප්‍රචාරය කළත්, බස්නාහිර පළාතේ, විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයට එම මුදල ලබා දීලාත් නැහැ. ඒ ගැන ගරු ඇමතිතුමාගේ අදහස මා දැන ගන්න කැමැතියි.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, මරදගහමුල ඉදිකර තිබෙන වී අළෙවි මණ්ඩලය සතු ගබඩා සංකීර්ණයේ අපි ගිය අවුරුද්දේත් වී ගබඩා කළා. දැනටමත් එම ස්ථානයේ වී කොටසක් ගබඩා කරලා තිබෙනවා. ඒ අනුව, ඒ ගබඩා දැනට පරිහරණයට අරගෙන තිබෙනවා.

එතුමා අහපු දෙවැනි කාරණයට අනුව, ගොවීන්ට වන්දි ගෙවීමේ වැඩසටහන යටතේ ගෙවීම් කරන්න පසුගිය සතියේ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පොළොන්නරුවේත්, ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අනුරාධපුරයේත්, මොණරාගලත් පටන් ගත්තා. මේ මස 15 වැනි දා වෙනකොට ගම්පහ දිස්ත්‍රික්කයේ ගෙවීම් කටයුතු සම්පූර්ණයෙන්ම ඉවර කරනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, ලංකාවේම ඒවා ගෙවලා ඉවර කරනවා.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු කථානායකතුමනි, වන්දි ගැන නොවෙයි මම ඇහුවේ. මිලියන දහසක් සමුපකාර ක්‍රමයක් යටතේ වෙන් කර තිබෙනවා, වී මෝල් හිමියන්ට වී මිලදී ගැනීමට. ඒ ගැනයි මම එතුමාගෙන් ඇහුවේ.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
සමුපකාර වැඩසටහන යටතේ දැනටමත් වී මෝල් හිමියන් 300 දෙනෙකුට අවශ්‍ය සහන සපයා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අපි අද ජීවන වියදම් කමිටු රැස්වීමේදී සාකච්ඡා කළා, දැනට වී අළෙවි මණ්ඩලය සතුව තිබෙන වී තොගත්, දිසාපතිවරු එක්ක සාකච්ඡා කරලා ඒ වී මෝල් හිමියන්ට බෙදා දෙන්න. ටෙන්ඩර් කරන්න ගියොත් පුද්ගලයන් එක්කෙනෙක්-දෙදෙනෙක් තමයි ඒවා ගන්නේ. ඒ නිසා අපි සංවර්ධන කටයුතු සඳහා සහන ලබා දුන් වී මෝල් හිමියන්ට එම වී ටික බෙදා දෙන්න කටයුතු කරනවා.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු කථානායකතුමනි, ගම්පහ දිස්ත්‍රික්කයට වෙන් කරපු මුදල් ලැබෙනවාද කියන එකයි මා අහන්නේ. 15 වැනි දා දෙනවා කිව්වේ, වන්දි. මම අහන්නේ වන්දි ගැන නොවෙයි. වී මෝල් හිමියන්ට වී මිලදී ගැනීමට වැඩ පිළිවෙළක් ගම්පහ දිස්ත්‍රික්කයේ තිබෙනවාද කියලායි මා අහන්නේ.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගම්පහ දිස්ත්‍රික්කයටත් අනෙක් දිස්ත්‍රික්කවලට අදාළ වෙන විධියට ඒ ගෙවීම් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ මුදල් දෙනවා, ගන්න.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ඔව්, අපි ඒ මුදල් දෙනවා.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, වගා නොකරන කුඹුරු වෙනත් ආර්ථික කටයුත්තකට යොදා ගන්න වැඩ පිළිවෙළක්, අවස්ථාවක් දෙන්නේ නැහැ කියලා.

අපේ ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා කලින් ප්‍රශ්නයකදී ප්‍රකාශ කළා, කුණු එක් රැස් කිරීම සඳහා පහත් බිම් සංවර්ධන මණ්ඩලයෙන් මුතුරාජවෙල ප්‍රදේශයේ බිම් ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා කියලා. මේ වෙද්දි පහත් බිම් සංවර්ධන මණ්ඩලය ශීඝ්‍රයෙන් ඉඩම් ගොඩ කරමින්, ව්‍යාපාරික ස්ථානවලට බදු දෙමින් යනවා. ඒවාට කිසිම ටෙන්ඩර් පටිපාටියක් නැහැ. ඒ වාගේම කෘෂිකර්ම අමාත්‍යාංශය විධියට ඒ කලාපය තුළ මේ කටයුතු කරන්න ඒ අදාළ පළාත් නියෝජිතයන්ට සහ ප්‍රාදේශීය නියෝජිතයන්ට වගකීමක් බාර දීලා නැහැ. කුඹුරු ආඥාපනතට පටහැනිව මේ වනකොට මුළු මුතුරාජවෙලම ගොඩ කරමින්, විශාල පරිසර විනාශයක් සිදු කරමින් පවතිනවා. මේක මීගමුව කළපුවටත්, මේ හරහා ගලා යන හැමිල්ටන් ඇළටත් දැඩිව

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

බලපානවා. කෘෂිකර්ම ඇමතිවරයා විධියට ඔබතුමාට මේ සම්බන්ධයෙන් පැමිණිලි ලැබිලා තිබෙනවාද, ඒ වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලා මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි, පහත් බිම් සංවර්ධන මණ්ඩලය මුතුරාජවෙල ගොඩ කරගෙන යනවා, කිසිම ටෙන්ඩර් කැඳවීමකින් තොරව පෞද්ගලික අංශයට ඒ ඉඩම් දෙනවා කියනවා.. ඒක අමූලික අසත්‍යයක්. මුතුරාජවෙල කලාපය ගත්තාම කලාප තුනක් තිබෙනවා. එකක් තමයි, සංරක්ෂිත ප්‍රදේශය. අනික තමයි, සංවර්ධනය සඳහා යොදා ගන්නා ප්‍රදේශය. කෙරවලපිටිය බලාගාරය, ෂෙල් ගෑස් සමාගම ආදිය පිහිටලා තිබෙන්නේ ඒ සංවර්ධන කලාපයේ. ඒ දෙක අතර සම්ප්‍රේෂණ කලාපය - buffer zone එක - තිබෙනවා. පහත් බිම් සංවර්ධන මණ්ඩලය විසින් සංවර්ධන කලාපය තමයි සංවර්ධනය කරන්නේ. එකම ඉඩමක්වත් ටෙන්ඩර් පටිපාටියෙන් පිට ලබා දීලා නැහැ. ඒ බව මම බොහොම පැහැදිලිව කියන්න ඕනෑ.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු කථානායකතුමනි, මම අහපු ප්‍රශ්නයට පී.හැරිසන් අමාත්‍යතුමා පිළිතුරක් දුන්නේ නැහැ. ක්‍රමවේදය ඉදිරිපත් කරයි, ඒක මම ලබා ගන්නම්.

ඒ නාම ලේඛනයට යටත්ව තිබෙන ඒ අවට තිබෙන කුඹුරු කොටස් මේ වනකොට ගොඩ කරමින් පවතිනවා. ඒ වෙනුවෙන් එතුමාට පැමිණිලි ලැබිලා තිබෙනවාද, ඒ වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලායි මම ඇහුවේ.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, පැමිණිලි ලැබිලා තිබෙනවා. ඒවාට නීත්‍යානුකූලව කටයුතු කරලා තිබෙනවා. එතුමාටත් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්න තිබෙනවා නම් ඉදිරිපත් කරන්න. අපි ඒ වෙනුවෙනුත් නීත්‍යානුකූලව කටයුතු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -544/'19-(1), ගරු බිමල් රත්නායක මැතිතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය ගැන ලේකම් කාර්යාලයෙන් මට පැහැදිලි කිරීමක් එවලා තිබෙනවා. මා එය කියවන්නම්.

න්‍යාය පත්‍රයේ 9 - 544/'19 අංකය දරන, ගරු බිමල් රත්නායක මහතා විසින් ඉදිරිපත් කර තිබූ ප්‍රශ්නයට පිළිතුරු ලබා ගැනීම සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යවරයා වෙත ජුනි 07 වැනි දින යොමු කර තිබුණි. කෙසේ වුවද ප්‍රශ්නය එම අමාත්‍යාංශයේ විෂයය පථයට අයත් නොවන බව එම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ 05.08.2019 දිනැති ලිපිය මඟින් -ඊයේ දින- පාර්ලිමේන්තුවට දැනුම් දී ඇත.

මෙලෙස මාස දෙකකට ආසන්න කාලයක් ගතවීමෙන් පසු, ප්‍රශ්නය තම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් නොවන බව දැනුම් දීම හේතුවෙන් ප්‍රශ්නය නැවත අදාළ අමාත්‍යාංශයට කල් වේලා ඇතිව යොමු කිරීමට තිබූ අවස්ථාව මහ හැරී ඇති බව දන්වා සිටින අතර, කෙසේ වුව ද ඉතා කඩිනමින් පිළිතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්නය අදාළ අමාත්‍යාංශයට යොමු කරන ලෙස නියෝග කරන බවත් දන්වනු කැමැත්තෙමි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, මේ ප්‍රශ්නයට අදාළ අමාත්‍යාංශය සොයා ගැනීම දුෂ්කර බව. දැන් නම් මම දන්නවා, මේ ආයතනය BOI එක යටතේ තිබෙන නිසා මේ ප්‍රශ්නය යා යුතු අමාත්‍යාංශය කුමක්ද කියලා. මේ තිබෙන්නේ තුල්හිරිය පේශ කර්මාන්තශාලාවේ භූමියේ පදිංචිව සිටින -අවුරුදු විසි ගණනක් තිස්සේ සිටින- සේවක පවුල් 43ක් නෙරපා දැමීම සම්බන්ධ ප්‍රශ්නයක්. මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරලා මාස ගණනාවක් වෙනවා. ආණ්ඩුව විටින් විට විෂයයන් වෙනස් කරනවා; ඇමතිවරුන් වෙනස් කරනවා. ඇත්තටම, අමාත්‍යාංශ කීපයක හැර, ඒ ඒ ආයතන අයත් වන්නේ කුමන අමාත්‍යාංශවලටද යන්න සොයා ගන්න අපට පුළුවන් වේවි කියලා මා හිතන්නේ නැහැ. ඒ ගැන ඇමතිවරු දන්නේත් නැහැ. මා දැන් දැනුවත් වූ පරිදි එම ආයතනය BOI එකටයි අදාළ වන්නේ. ගරු කථානායකතුමනි, ඒ නිසා මා ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා, මෙම ප්‍රශ්නය සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයට යොමු කරලා ඉතා ඉක්මනින් පිළිතුරක් ලබා දෙන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලි කැණීම් සඳහා නිකුත් කළ බලපත්‍ර : විස්තර
### பொலன்னறுவை மாவட்டத்தில் மணல் அகழ்வுக்காக உரிமம் வழங்கல்: விபரம்
### LICENCES FOR SAND MINING IN POLONNARUWA DISTRICT: DETAILS

598/'18

**10. ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලි කැණීම් කටයුතු සඳහා බලපත්‍ර ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුද්ගලයන්ගේ නම්, ලිපින හා දුරකථන අංක කවරේද;

(iii) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දැනට වැලි සම්බන්ධයෙන් මතු වී ඇති ඒකාධිකාරිත්වය මැඩ පැවැත්වීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு மாகாண அபிவிருத்தி மற்றும் இளைஞர் அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2010 ஆம் ஆண்டு தொடக்கம் இன்று வரை பொலன்னறுவை மாவட்டத்தில் மணல் அகழ்வு நடவடிக்கைகளுக்காக உரிமம் வழங்கப் பட்டுள்ள நபர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி நபர்களின் பெயர்கள், முகவரிகள் மற்றும் தொலைபேசி இலக்கங்கள் யாவை என்பதையும்;

(iii) பொலன்னறுவை மாவட்டத்தில் தற்போது மணல் தொடர்பாக ஏற்பட்டுள்ள ஏகபோக உரிமையை தடுப்பதற்காக அமைச்சு மேற் கொள்ளும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல் ஏன்?

asked the Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development and Youth Affairs:

(a) Will he inform this House -

(i) the number of persons to whom licences have been issued for sand mining in the District of Polonnaruwa from 2010 up to date;

(ii) the names, addresses and the telephone numbers of the aforesaid persons; and

(iii) the steps that will be taken by the Ministry to control the monopoly that has been created pertinent to sand industry in the District of Polonnaruwa?

(b) If not, why?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් වාර්තා කර ඇති පරිදි, 2010 මැයි මස සිට 2015 වසර දක්වා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලි කැණීම් කටයුතු සඳහා පුද්ගලයන් 243 දෙනෙකුට සහ මේ දක්වා ජී.එස්.එම්.බී. තාක්ෂණික සේවා (පුද්) සමාගම වෙත බලපත්‍ර නිකුත් කර ඇත.

(ii) බලපත්‍රලාභීන්ගේ නම්, ලිපින ඇතුළු ලේඛනය ඇමුණුම් අංක 01 ලෙස ඉදිරිපත් කරමි. පුද්ගලයන්ගේ දුරකථන අංක දත්ත ගබඩාවට ඇතුළත් කර නොමැති බව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් වාර්තා කර ඇත.

ගරු මන්ත්‍රීතුමා, එම නම්, ලිපිනයන් කියවන්න ඕනෑද? ඇමුණුම සභාගත කරන්න ද? කියවන්න ඕනෑද?

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
ටිකක් කියවන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
නම් 243ක් කියවන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ නම් 243 ම කියවීම අවශ්‍ය ද ගරු මන්ත්‍රීතුමා?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
243 දෙනකුගේ නම්, ලිපින ආදිය තිබෙනවා.

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
එහෙම නම්, සභාගත කරන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඔබතුමාට ඊට අදාළව ප්‍රශ්නයක් අහන්න ඕනෑ නම්, අයෙත් දවසක ප්‍රශ්නයක් අහන්න පුළුවන් නේ.

ඇමුණුම 01 **සභාගත*** කරනවා.

(iii) පැවැති පාරිසරික ගැටලු මත පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියලු වැලි කැණීම් සඳහා බලපත්‍ර, රජයට අයත් සමාගමක් වන ජී.එස්.එම්.බී. තාක්ෂණික සේවා (පුද්ගලික) සමාගම වෙත නිකුත් කිරීමට තීරණය කර ඇත. ඒ අනුව, මේ වන විට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියලු වැලි කැණීම් බලපත්‍ර ජී.එස්.එම්.බී. තාක්ෂණික සේවා (පුද්ගලික) සමාගම වෙත කිතුත් කර ඇත.

පරිසරයට හානි කරමින් සිදු කරනු ලැබූ වැලි කැණීම් බලපත්‍ර අත්හිටුවා, පරිසර හිතකාමී ලෙස ඉදි කිරීම් ක්ෂේත්‍රය සඳහා අවම මිලකට වැලි සැපයීම යන කරුණු පාදක කරගෙන රජයට අයත් ජී.එස්.එම්.බී. තාක්ෂණික සේවා (පුද්ගලික) සමාගම වෙත බලපත්‍ර නිකුත් කර ඇත.

(ආ) පැන නොනඟී.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමාට පැහැදිලි කිරීමක් අවශ්‍යද?

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
ඔව්, ගරු කථානායකතුමනි. ගරු රාජ්‍ය ඇමතිතුමා නම්, ලිපින හා දුරකථන අංක ඇතුළත් ලේඛනය සභාගත නොකර කියෙව්වා නම් මට හරියටම මේ පිළිබඳව දැන ගන්න තිබුණා. ගරු කථානායකතුමනි, දැනට මේ දීලා තිබෙන බලපත්‍රවල මම හිතන විධියට ඒ ස්ථානය නැහැ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ වන විට සෝමාවතිය අසබඩ මහවැලි ගඟෙන් සතියකට දෙවතාවක් විතර රාත්‍රියට වැලි ටිපර් 200ක් විතර හිටපු ගමන් එනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම දන්නා හැටියට භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයෙන් හෝ වෙනත් තැනෙකින්වත් එවැනි ආකාරයේ කටයුතුවලට බලපත්‍ර දීමක් ගැන සඳහන් වෙන්නේ නැහැ. ඒ ආකාරයට වැලි ප්‍රවාහනය කිරීම ගැන ගරු රාජ්‍ය ඇමතිතුමා දැනුවත් වෙලා තිබෙනවා ද දන්නේ නැහැ. ඒ විධියට වැලි ටිපර් 200ක් විතර එනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මම දැන් එම පුද්ගලයන්ගේ නම්, ලිපින හා දුරකථන අංක ඇතුළත් ලැයිස්තුව ඔබතුමාගේ අතටම දෙන්නම්. ගරු කථානායකතුමනි, මනම්පිටිය ප්‍රදේශය පිහිටි පොලොන්නරුව දිස්ත්‍රික්කයේ තමයි ලංකාවේ වැඩිම වැලි ජනනයවීම සිද්ධ වෙන්නේ. මේ කටයුතුවලදී විශාල වංචා සිද්ධ වෙනවා කියලා ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කරන එක ඇත්ත. ඒක අද-ඊයේ ඉඳන් නොවෙයි, එදා ඉඳන්ම සිද්ධ වෙන දෙයක්. පෞද්ගලිකව කරන වැලි කැණීම් සියල්ලම නවත්වලා රජයේ ආයතනයක් වන GSMB Technical Services ආයතනයට මේ බලපත්‍රය ලබා දුන්නා, අතිගරු ජනාධිපතිතුමා විෂය භාර ඇමතිවරයා වශයෙන් වැඩ බාර ගත්තාට පස්සේ. ලංකාවේ වැඩියෙන්ම වැලි ජනනය වෙන පළාතක තමයි මේ තරම් වැලි ජාවාරම් සිද්ධ වෙන්නේ. ඒ ආකාරයට ඒ කටයුතු රජයට බාර දුන්නත්, ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන විධියට විටින් විට විශාල වංචා සිදු වෙනවා. ඒ නිසා විෂය භාර ඇමතිවරයා වශයෙන් අතිගරු ජනාධිපතිතුමා ජනාධිපති විමර්ශන ඒකකයට නියෝගයක් දුන්නා, මේ වංචා නතර කරන්න පුළුවන් කොහොමද කියලා සොයා බලා වාර්තාවක් සපයන්න කියලා. ජනාධිපති විමර්ශන ඒකකය කරුණු 10ක් ඉදිරිපත් කරමින් කියා තිබෙනවා, මෙන්න මේ ක්‍රියාදාමයට අනුව කටයුතු කිරීමෙන් මේ ජාවාරම් නවත්වන්න පුළුවන් වෙයි කියලා. වර්තමානය වන විට GSMB Technical Services ආයතනය ඒ ක්‍රියාදාමය ක්‍රියාත්මක කරලා ඉවර කළ කරුණු තිබෙනවා; සමහර ඒවා තවම ක්‍රියාත්මක වෙමින් පවතිනවා. අපි බලාපොරොත්තු වෙනවා, මේ ක්‍රියාදාමය ඉවර වෙනකොට මේ වංචාසහගත දේවල් නතර වෙයි කියලා. ඔබතුමා කියනවා වාගේ, මේ වැලි ජාවාරම නිසා පසුගිය දවස්වල හමුදා නිලධාරින් පවා මරුමුවට පත් වෙච්ච අවස්ථා තිබුණු බව අපි දැක්කා. වැලි ජාවාරම ඒ විධියට මේ රටේ බොහොම තදින් සිද්ධ වෙනවා. මම නියෝජනය කරන දිස්ත්‍රික්කයේත් පස් ජාවාරම නිසා අතීතයේ සිටම 50ක්, 60ක් මැරිලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, වැලි ජාවාරමත් ඒ වාගේම සිදු වෙනවා. නමුත්, අපි ත්‍රිවිධ හමුදාව ඇතුළු ආරක්ෂක අංශ භාවිත කරමින් භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය ඒ කටයුතු මැඩ පැවැත්වීමට කටයුතු කරනවා. නමුත්, එතුමාගේ මේ පෙන්වා දීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. එම ප්‍රදේශයේ තමයි වැඩිම වැලි ජාවාරම් සිද්ධ වෙන්නේ. අපට එය සියයට 100ක් පාලනය කර ගැනීමට තවමත් නොහැකි තත්ත්වයක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11 -625/'18- (1), ගරු ශෙහාන් සේමසිංහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## කොළඹ දිස්ත්‍රික්කයේ පහත් බිම් ගොඩ කිරීම: තහනම
கொழும்பு மாவட்டத்தில் தாழ் நிலங்களை மீட்டல்: தடை
RECLAMATION OF LOW-LYING LANDS IN COLOMBO DISTRICT: PROHIBITION

697/'19

**12. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ, පහත් බිම් ගොඩ කිරීම, නාගරික සංවර්ධන අධිකාරිය විසින් තහනම් කර තිබේ නම්, එම තහනම සිදු කළ වර්ෂය කවරේද;

(ii) මේ වනවිට එම තහනම ඉවත් කර තිබේ නම්, තහනම ඉවත් කළ වර්ෂය සහ ඊට බලපෑ හේතු කවරේද;

(iii) 2015.01.10 දින සිට මේ දක්වා නාගරික සංවර්ධන අධිකාරිය හෝ ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් කොළඹ දිස්ත්‍රික්කයේ පහත් බිම් කොපමණ සංඛ්‍යාවක් ගොඩ කිරීම සඳහා අනුමතිය ලබා දී තිබේද;

(iv) එම අනුමතීන් ලබා දී ඇති පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு மாவட்டத்தில் தாழ் நிலங்களை மீட்டல் நகர அபிவிருத்தி அதிகாரசபையால் தடைசெய்யப்பட்டிருப்பின், அத்தடை எந்த ஆண்டில் கொண்டு வரப்பட்டது என்பதையும்;

(ii) இன்றளவில் குறித்த தடை நீக்கப்பட்டிருப்பின், தடை நீக்கப்பட்ட ஆண்டு மற்றும் அதற்கு ஏதுவாயமைந்த காரணங்கள் யாவை என்பதையும்;

(iii) 2015.01.10 ஆம் திகதி தொடக்கம் இன்று வரை நகர அபிவிருத்தி அதிகாரசபை அல்லது இலங்கை காணி மீட்டல் மற்றும் அபிவிருத்திக் கூட்டுத்தாபனம் கொழும்பு மாவட்டத்தில் எத்தனை தாழ் நிலங்களை மீட்க அங்கீகாரம் அளித்துள்ளது என்பதையும்;

(iv) மேற்படி அங்கீகாரங்கள் வழங்கப்பட்டுள்ள ஆட்களின் பெயர் யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Megapolis and Western Development:

(a) Will he inform this House-

(i) if the Urban Development Authority has prohibited the reclamation of low-lying lands in the District of Colombo, the year on which that ban was imposed;

(ii) if that ban has been lifted by now, the date on which the ban was lifted and the reasons which led to that;

(iii) the number of low-lying lands in the District of Colombo for which approval has been granted by the Urban Development Authority or the Sri Lanka Land Reclamation and Development Corporation to reclaim from 10.01.2015 up to now; and

(iv) the names of the persons to whom the approval was given?

(b) If not, why?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ලේකම්, නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශය සහ සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය මඟින් 2003.09.21 දිනැති පුවත් පත් නිවේදනයක් මඟින් පහත සඳහන් කටයුතු වසර 3ක් සඳහා අත්හිටුවන ලෙස මහජනයා වෙත දන්වා ඇත.

1. තෙත් බිම්, වගුරු බිම්, කුඹුරු, පුරන් වූ කුඹුරු, ජලාශ හා සම්බන්ධ සංවර්ධන කටයුතු සඳහා කිසිදු අයදුම්පතක් අදාළ ආයතන වෙත ඉදිරිපත් නොකරන ලෙසත්;

2. සියලු අනවසර ගොඩ කිරීම් නවතන ලෙසත්;

3. අනවසරයෙන් ගොඩ කරන ලද ඉඩම් යථා තත්ත්වයට පත් කරන ලෙසත්;

4. ඉහත ස්ථානවල කර ඇති සියලු අනවසර ඉදිකිරීම් වහා ඉවත් කරන ලෙසත්.

වරින් වර කරන ලද පුවත් පත් නිවේදන මඟින් මෙම අත්හිටුවීම 2008 අප්‍රේල් 30 දක්වා දීර්ඝ කර ඇත.

(ii) 2008 වර්ෂයේ අප්‍රේල් 30 දිනෙන් පසුව මෙම අත්හිටුවීම තව දුරටත් දීර්ඝ නොකිරීම හේතුවෙන් අවසන් වී ඇත.

බස්නාහිර පළාතේ දිස්ත්‍රික්කවල පිහිටා ඇති තෙත් බිම්, වගුරු බිම්, කුඹුරු, පුරන් වූ කුඹුරු හා ජලාශ පිළිබඳව අධ්‍යයනයක් කර, ඒ හා සම්බන්ධ කළමනාකරණය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් පිළියෙල කිරීමටත්, ව්‍යවස්ථා හා ක්‍රියා පටිපාටි සම්පාදනය කිරීම සිදු කෙරෙන තෙක් උක්ත අත්හිටුවීම සිදු කර තිබුණි. ඒ අතුරතුර කාලයේදී බස්නාහිර පළාත් තෙත් බිම් කලාපීකරණ මාර්ගෝපදේශ රෙගුලාසි සැලැස්ම 2006දී සකස් කර අවසන් කරන ලදී. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය බස්නාහිර පළාතට අදාළ සංවර්ධන සැලැස්ම සැකසීමේදී තෙත් බිම් කලාපීකරණ මාර්ගෝපදේශ රෙගුලාසි එයට ඇතුළත් කර, අදාළ පාලාත් පාලන ආයතනයේ සංවර්ධන සැලැස්ම ගැසට් කිරීමේදී එම තෙත් බිම් කලාපීකරණ මාර්ගෝපදේශ රෙගුලාසි සැලැස්ම අන්තර්ග්‍රහණය කර ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව එම අත්හිටුවීම 2008 අප්‍රේල් 30 දිනෙන් පසු දීර්ඝ නොකරන ලදී.

(iii) පහත් බිම් සංවර්ධනය පිළිබඳව 2011.02.07 දිනැති 1692/2 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව පහත සඳහන් ආයතනවලින් සමන්විත පහත් බිම් සංවර්ධනය සඳහා වූ සැලසුම් කමිටුවේ නිර්දේශය මත පහත් බිම් ගොඩ කිරීම සඳහා අනුමැතිය ලබා දේ.

(i) මධ්‍යම පරිසර අධිකාරිය

(ii) නාගරික සංවර්ධන අධිකාරිය

(iii) ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

(iv) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව; සහ

(v) විශේෂ අවස්ථාවලදී අදාළ පළාත් පාලන ආයතනය හා අදාළ පළාත් සභා ආයතන.

ඒ කියන්නේ, පළාත් සභාවේ ගොවිජන සේවා ඇතුළු ආයතන

2015.01.10 දින සිට 2019.04.02 දින දක්වා පහත්බිම් සංවර්ධනය සඳහා වූ කමිටුවේ නිර්දේශය මත ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් කොළඹ දිස්ත්‍රික්කයේ පහත්බිම් ගොඩකිරීම සඳහා ඉල්ලුම් කර ඇති ප්‍රමාණය සහ අනුමැතිය ලබා දී ඇති ප්‍රමාණය පහත පරිදි වේ.

| වර්ෂය | ඉල්ලුම් කර ඇති ප්‍රමාණය | | | අනුමත කර ඇති ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|
| | අක්කර | රූඩ් | පර්චස් | අක්කර | රූඩ් | පර්චස් |
| 2015 | 61 | 2 | 14.00 | 22 | 3 | 39.4 |
| 2016 | 52 | 0 | 30.80 | 22 | 0 | 23.37 |
| 2017 | 171 | 2 | 10.18 | 12 | 2 | 4.51 |
| 2018 | 47 | 2 | 22.70 | 9 | 2 | 17.00 |
| 2019 | 36 | 1 | 5.53 | 1 | 1 | 21.25 |

ඒ අනුව 2015.01.10 දින සිට 2019.04.02 දින දක්වා කාලසීමාව තුළ ගොඩකිරීම සඳහා ඉල්ලුම්කර ඇති මුළු පහත් බිම් ප්‍රමාණය අක්කර 369 රූඩ් 1 පර්චස් 3.21 වේ. ඉන් අක්කර 68 රූඩ් 2 පර්චස් 25.53ක් සඳහා පමණක් අනුමැතිය ලබා දී ඇත.

එසේම 2015.01.10 දින සිට 2019.04.02 දින දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා

[ගරු පාඨලී චම්පික රණවක මහතා]

සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් අනවසර ගොඩකිරීම් පිළිබඳ පවරන ලද නඩු ප්‍රමාණය 59කි.

(iv) එම අනුමැතිය ලබා දී ඇති පුද්ගලයන්ගේ නම්, ඇමුණුම මඟින් ඉදිරිපත් කර ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය ඇසීමේ අවස්ථාව ගරු නිමල් ලාන්සා මන්ත්‍රීතුමාට ලබා දෙනවා. මම පළමුවැනි අතුරු ප්‍රශ්නය පමණයි අහන්නේ.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. 2010 වර්ෂයේ මේ පාර්ලිමේන්තුවද ඇතුළුව කොළඹ නගරය යට වුණු බව ඔබතුමාට මතක ඇති. මන්ත්‍රීවරුන්ට Buffaloesවලින් පාර්ලිමේන්තුවෙන් ඉවත් වෙන්න සිදු වුණා. 2010 වර්ෂයේ ඇති වූ ගංවතුරින් පසුව 2011 සිට 2015 දක්වා කාලය තුළ කිසිම ගංවතුරකින් කොළඹ නගරය යට වුණේ නැහැ. නමුත් මේ වන විට කුඩා වැස්සට පවා කොළඹ නගරය යට වෙන තත්ත්වයක් උදා වී තිබෙනවා.

කොළඹ ඉන්න අපි ඒක පෞද්ගලිකව දන්නවා. මේ කොළඹ නගරය යට වීමට හේතු සහ පහත් බිම් ගොඩ කිරීමට පසුගිය කාලයේ කරපු කටයුතු එයට බලපා තිබෙනවාද කියා තමුන්නාන්සේලාගේ අධ්‍යයනය අනුව සොයා ගෙන තිබෙනවාද කියා දැන ගන්න කැමැතියි.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

මීට මොහොතකට කලින් කෘෂිකර්ම ඇමතිතුමා කිව්වා, බස්නාහිර පළාතේ පුරන් වූ කුඹුරු ප්‍රමාණය හෙක්ටෙයාර් 13,000ක් කියලා. පසුගිය දශක දෙක තුනක කාලය තුළ බස්නාහිර පළාතේ තෙත් බිම්, අතහැර දමන ලද කුඹුරුවලින් සියයට 60ක් පමණ ස්වාභාවික හේතු සහ අනෙකුත් කාරණා මත ඉබේම ගොඩ වෙලා තිබෙනවා. ඒ අනුව තමයි තෙත් බිම් කළමනාකරණ ක්‍රියාකාරී සැලසුමක් සකස් කර තිබෙන්නේ. අපි මේ වසරේදී නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුමට ඇතුළත් කළා, කොළඹ සහ මේ අවට ප්‍රදේශ ජලයෙන් මතු වූ නගර ලෙස හඳුනාගෙන කටයුතු කරන්න. ඒ නිසා අපි ඉතාම තද පාරිසරික නීති පනවා තිබෙනවා. ඒ වාගේම, මධ්‍යම පරිසර අධිකාරිය, ගොවි ජන සේවා මධ්‍යස්ථාන ඇතුළු සියලු ආයතනවල විද්‍යාඥයන් ස්ථානීය පරීක්ෂා කර, නිශ්චිතව අනුමැතිය දෙන ඒවා පමණයි කරන්නේ.

ගංවතුර උවදුර ගැන කියනවා නම්, 2010 තමයි එහි වැඩිම තත්ත්වයක් දක්නට තිබුණේ. 2016දීත් ඊට වඩා අඩු ප්‍රමාණයෙන් වැස්සා. ඒ ප්‍රශ්න මතු වුණා. අද අපි ජලාශ ඉදි කිරීමේ කටයුත්තට අමතරව, කැලණි ගඟේ ජල මට්ටම ඉහළ ගියාට පස්සේ පාලනය කරන්න පොම්පාගාර ගණනාවක් ඉදි කරන්න කටයුතු කරගෙන යනවා. තව මාස කිහිපයකින් ඒ වැඩ කටයුතු අවසන් වෙනවා. පළමුවැනි පොම්පාගාරය, අඹතලේත්, දෙවන පොම්පාගාරය කොළඹ තොටළඟ ප්‍රදේශයේත් ඉදි කරනවා. තුන්වැනි පොම්පාගාරය අනාගතයේ කොලොන්නාව කළු පාලම ප්‍රදේශයේ ඉදි කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, කොලොන්නාව ප්‍රදේශයේ කිත්තම්පව්ව සහ අනෙකුත් ඇළ මාර්ග පිළිසකර කිරීම දැන් අපි සිදු කරගෙන යනවා.

ඒ වාගේම, කොළඹ නගරයේ තිබෙන ජලය, ජලාශවලින් මුහුදට ගෙන යන්න බැරි නිසා භූගත උමං පද්ධති හතරක් ඉදි කිරීමට යෝජනා කරලා, ඒ අවශ්‍ය කටයුතු කර තිබෙනවා. එයින් පළමුවැනි උමං පද්ධතිය ඉදි කිරීමේ කටයුතු දැන් ආරම්භ කර තිබෙනවා, මට්ටක්කුලිය ප්‍රදේශයේ. දෙවැනි උමං පද්ධතිය රාජකීය විද්‍යාලය අසල සිට සහ තුන්මුල්ල හන්දියේ සිට ආරම්භ කර ජලය මුහුදට ගෙන යැමට කටයුතු කරනවා. හතරවැනි උමං පද්ධතිය කිංසි පාරේ සිට ඩී.එස්. සේනානායක විද්‍යාලය හරහා කටු ඇළ මාර්ගය දක්වා ප්‍රදේශයේ අපි කිසියම් ප්‍රමාණයකට ඉදි කළා. හතරවැනි එක අපි බොරැල්ල ප්‍රදේශයේ සිට දේවි බාලිකා විද්‍යාලය හරහා අනෙක් පැත්තට එකතු කර තිබෙනවා. අපි බලාපොරොත්තු වනවා, අවුරුදු 20කට විතර වතාවක් එන ඉතාම තද ගංවතුරකට පවා ඔරොත්තු දෙන, 2010 ඇති වුණා වාගේ තත්ත්වයකට පවා ඔරොත්තු දෙන පද්ධතියක් මේ මඟින් ඇති වේවි කියලා. ඉදිකරණ ජලාශවලට අමතරව, කැලණි ගඟේ ජල මට්ටම ඉහළට ගිය අවස්ථාවේදී මේ තුළින් ජලය පොම්ප කිරීමට හැකියාව ලැබෙනවා.

ඒ වාගේම, මැතදීත් -මේ ඊයේ පෙරේදාත්- නාගලගම් වීදිය සහ අනෙකුත් ස්ථානවලට ගැළපෙන පරිදි, පොම්පාගාරයක් මරදාන සෙන්ට් සෙබෙස්තියන් ස්ථානයේ ඉදි කිරීමේ කටයුතු ආරම්භ කළා. මේ ආකාරයට ජලය පොම්ප කිරීම මඟින් හදිසි තත්ත්වයකදී මුහුණ දෙන්න බලාපොරොත්තු වනවා.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)

ගරු කථානායකතුමනි,ගරු චම්පික රණවක අමාත්‍යතුමාගෙන් මම දෙවන අතුරු ප්‍රශ්නය අහනවා.

ඊයේ අතිගරු ජනාධිපතිතුමා කිව්වා, මුතුරාජවෙල ප්‍රදේශය දේශපාලනඥයන් විසින් කුණු ගොඩක් කරලා තිබෙනවා කියලා. මම ඊයේ එම ස්ථානයට ගියාම දැකපු ප්‍රධාන දෙයක් තමයි, මුතුරාජවෙලට දැමිය යුතු ප්‍රමාණයට වඩා වැඩි ධාරිතාවකින් කුණු දමා තිබෙන බව. ගරු ඇමතිතුමාත් දැන් එය පිළිගත්තා. මේ කුණු දැමීම නිසා දැන් ඒ ප්‍රදේශයේ අයට ඉන්න බැහැ, ඒ ප්‍රදේශය සම්පූර්ණයෙන් ගඳ ගහනවා. එම කුණු ටික එතැනින් ඉවත් කරලා කළමනාකරණය කරන්නේ කවදාද කියලා මම ඇමතිතුමාගෙන් දැනගන්න කැමතියි. ඔබතුමා පරිසරයට ඉතා ළැදි කෙනෙක්. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා පහත් බිම් සංවර්ධන මණ්ඩලයේ සභාපතිතුමා ගම්පහ දිස්ත්‍රික්කයේ ඉඩම් ඔක්කෝම පුරවනවා. ඒක highway එකේ -උඩින්- යද්දි ඔබතුමාට පෙනෙනවා ඇති. කුඹුරු ඉඩම් ගොඩ කරනවා, පහත් බිම් ගොඩ කරනවා, ඒ වාගේම, ප්‍රදේශයේ ජලය රැස්වෙන සියලු ඉඩම් ගොඩ කරගෙන යනවා. මේ සඳහා සියලු අනුමැතිය දීලා තිබෙනවා ඒ සංස්ථාවේ සභාපතිතුමා. මම අහන්නේ, එතුමාට විරුද්ධව ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියලායි.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ඔබතුමා පාර්ලිමේන්තුවේ වරප්‍රසාද පාවිච්චි කරලා ඒ සභාපතිතුමන්ලාට චෝදනා කරන්න එපා. කරුණාකරලා එවැනි

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

සිද්ධියක් තිබෙනවා නම් මා වෙත වාර්තා කරන්න. ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට පමණක් තනිවම ඉඩම් ගොඩ කරන්න බැහැ. අපි ඉතා පැහැදිලිව කිව්වා, මධ්‍යම පරිසර අධිකාරිය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව යනාදී සියලු දෙපාර්තමේන්තුවලින් යුක්ත විද්වත් කමිටුවකින් තමයි ඒ කටයුත්ත කරන්නේ කියලා. එසේ නොකර තිබෙනවා නම් මා වෙත පැමිණිලි කරන්න. අපි ඒ අනුව ක්‍රියා කරනවා.

ඒ වාගේම, කැළි කසළ ප්‍රශ්නය ගැනත් කියන්න ඕනෑ.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු අමාත්‍යතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමාට පිළිතුරු දෙන්න අවස්ථාව දෙන්න.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
අපි මුතුරාජවෙල ප්‍රදේශයේ, කෙරවලපිටිය ප්‍රදේශයේ තාවකාලික කසළ අංගනයක් ඇති කළේ මීතොටමුල්ලේ ඇති වෙච්ච ඛේදවාචකය නිසායි. මුළු කොළඹ නගරයේම ටොන් 6,000ක් කසළ එකතු වුණා. ඒ නිසා ඉස්පිරිතාලවල කුඩා corridorsවල පවා ඩෙංගු රෝගීන් පිරුණා. ඒ තත්ත්වය යටතේ, කසළ ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් ගොඩනඟා ගන්නා තෙක් තාවකාලික පිළියමක් හැටියටයි අපි කටයුත්ත කළේ. අපි ව්‍යාපෘතිය පටන් ගත්තේ අවුරුද්දක කාලයකටයි. අපි කොළඹ නගර සභාවට විටින් විට ඒ බව දැනුම් දුන්නා. අපි පසුගිය සැප්තැම්බර් මාසයේ ඉඳන් දැනුම් දුන්නා මෙතැන ධාරිතාව ඉක්මවා ගිහින් තිබෙනවා, ඒ නිසා කරුණාකරලා එතැනට කුණු දමන්න එපා කියලා. මම මේ අවස්ථාවේ දී මේ සභාවට කියනවා, අපි දැන් කොළඹ නගර සභාවේ එම කටයුත්ත තාවකාලිකව නවත්වා තිබෙන බව. නමුත්, වත්තල, කැලණිය ආදී ප්‍රදේශවල කසළ ප්‍රශ්නය තවමත් විසඳිලා නැති නිසා අපි ඒවාට ලබන මාර්තු මාසය වෙනතෙක් ඉඩ දීලා තිබෙනවා. ලබන මාර්තු මාසයේ දුම්රිය මඟින් කැලණියේ වනවාසල සිට අරුවක්කාලුවලට කසළ ගෙන යැමේ සම්පූර්ණ ව්‍යාපෘතිය අවසන් වෙනවා. කෙරවලපිටියේ එතැන ගොඩගහලා, දැනට වැඩි වෙලා තිබෙන කසළ ප්‍රමාණය, - දැනට පෙනෙන්න තිබෙන ප්‍රමාණය - කාලයත් එක්කම පහෙන් එකකට වාගේ ප්‍රමාණයකට අඩු වෙනවා.

ඒ වාගේම දිරා නොගිය ප්‍රමාණයකුත් තිබෙනවා. අපි ඒවා ඉවත් කරලා ඉදිරි මාස කිහිපය ඇතුළත එම ස්ථානය ප්‍රතිෂ්ඨාපනය කරනවා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මටත් පැහැදිලි කර ගැනීමක් කර ගන්න පුළුවන්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න දෙකයි අහන්න පුළුවන්. සාමාන්‍යයෙන් නැවත අවස්ථාවක් දෙන්නේ නැහැ. ස්ථාවර නියෝග අනුව මට එහෙම කරන්න අමාරුයි. මීට කලිනුත් එවැනි පැහැදිලි කර ගැනීමකට අවස්ථාවක් දුන්නේ ගරු ඇමතිතුමාගේ කැමැත්තෙන් පමණයි. ගරු ඇමතිතුමනි, ගරු මරික්කාර් මන්ත්‍රීතුමාට අවස්ථාවක් දෙන්න පුළුවන්ද?

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
පුළුවන්.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු ඇමතිතුමනි, ගංවතුර පාලනය පිළිබඳව ගෙන ඇති ක්‍රියාමාර්ග ගැන ගරු ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ඔබතුමා කියපු ආකාරයට කොළොන්නාවේත්, කළු පාලම අසලත්, ගොතටුවේත් ඒ පොම්පාගාර ඉදිවනවා; කිත්තම්පහුව ඇළ මාර්ගය පිළිසකර කරනවා; අනෙක් ඇළ මාර්ග සම්බන්ධ කරනවා. ගරු ඇමතිතුමනි, හැබැයි පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. අවුරුදු තුනක් තිස්සේ මේ ඇළ මාර්ග ඔක්කෝම කිත්තම්පහුව ඇළට සම්බන්ධ කරලා ඒ හරහා පොම්පාගාරවලට ජලය ගෙන එන ව්‍යාපෘතිය දිගටම කර ගෙන ආවා. නමුත්, එම ව්‍යාපෘතියට මුදල් අමාත්‍යාංශයෙන් මේ අවුරුද්දේ මුදල් ලබා නොදීම නිසා එම කටයුත්තේ යම් කිසි අඩාළ වීමක් සිදුවෙලා තිබෙනවා. එම නිසා ඔබතුමා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරලා, එම ව්‍යාපෘතියේ අවසන් ප්‍රතිඵලය ගන්න නම් දැනට අඩාළ වී තිබෙන ඒ කටයුතු අවසන් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අපේ ගරු අගමැතිතුමාට එම ප්‍රශ්නය යොමු කළ යුතුයි. අපට මුදල් ලැබුණාම අපි ඒ කටයුතු කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 13 - 763/'19 - (1), ගරු සුසන්ත පුංචිනිලමේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 14 - 771/'19 - (1), ගරු ශාන්ත බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම: විස්තර
### இலங்கை அதிபர் சேவையின் III ஆம் வகுப்பிற்கு ஆட்சேர்ப்பு: விபரம்
RECRUITMENT TO SRI LANKA PRINCIPALS' SERVICE, GRADE III: DETAILS

883/'19

**15.ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වූ සීමිත තරඟ විභාගය 2015 වර්ෂයේ පවත්වා ඇති බව පිළිගන්නේද;

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

(ii) 2015 වර්ෂයේ මාර්තු 14,15,16,17,18,19,20 දිනවල සම්මුඛ පරීක්ෂණය පවත්වා ඇති බව දන්නේද;

(iii) එම සම්මුඛ පරීක්ෂණයෙන් බඳවා ගන්නා ලද පුද්ගලයන් බඳවා ගත් පදනම කවරේද;

(iv) එම පත්වීම්ලාභීන්ගේ නාම ලේඛනය මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(v) මෙම සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා නොගත් අයදුම්කරුවන්ට අභියාචනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දුන් බව පිළිගන්නේද;

(vi) මෙයින් 43දෙනෙකුට පත්වීම් ලබාදී ඇති බව දන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) අභියාචනා ඉදිරිපත් කර තිබූ අංක 1487 යටතේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි එස්.කේ.කේ. ගුණතිලක මහත්මිය, මෙම සම්මුඛ පරීක්ෂණයට කැඳවා නොමැති බව දන්නේද;

(ii) ඇය මෙම සම්මුඛ පරීක්ෂණයට නොකැඳවීමට හේතු කවරේද;

(iii) අතපසුවීමකින් ඇය සම්මුඛ පරීක්ෂණයට කැඳවා නොමැති නම්, ඇය නැවතත් සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් සපුරා ඇත්නම්, බඳවා ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை அதிபர் சேவையின் III ஆம் வகுப் பிற்கு ஆட்சேர்ப்புச் செய்வதற்கான வரையறுக் கப்பட்ட போட்டி பரீட்சையானது 2015 ஆம் ஆண்டு நடத்தப்பட்டுள்ளது என்பதை அவர் ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(ii) 2015 ஆம் ஆண்டு மார்ச் 14, 15, 16, 17, 18, 19, 20 ஆம் திகதிகளில் நேர்முகப் பரீட்சை நடத்தப் பட்டுள்ளது என்பதை அறிவாரா என்பதையும்;

(iii) மேற்படி நேர்முகப் பரீட்சையின் மூலம் ஆட் சேர்ப்பு செய்யப்பட்ட நபர்கள் ஆட்சேர்ப்பு செய்யப்பட்ட அடிப்படை யாதென்பதையும்;

(iv) மேற்படி நியமனங்களுக்கான பெயர்ப் பட்டியல் இச்சபைக்கு சமர்ப்பிக்கப்படுமா என்பதையும்;

(v) மேற்படி நேர்முகப் பரீட்சையின் மூலம் தெரிவு செய்யப்படாத விண்ணப்பதாரர்களுக்கு மேன் முறையீடுகளை சமர்ப்பிப்பதற்கு வாய்ப்பளிக்கப் பட்டது என்பதை ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(vi) அதில் 43 பேருக்கு நியமனங்கள் வழங்கப் பட்டுள்ளன என்பதை அறிவாரா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேல்முறையீட்டு செய்த 1487 இலக்கத்தின் கீழ் நேர்முகப் பரீட்சைக்குத் தோற்றிய திருமதி எஸ்.கே.கே. குணத்திலக்க இந்த நேர்முகப் பரீட்சைக்கு அழைக்கப்படவில்லை என்பதை அறிவாரா என்பதையும்;

(ii) அவர் இந்த நேர்முகப்பரீட்சைக்கு அழைக்கப் படாதமைக்கான காரணம் யாதென்பதையும்;

(iii) தவறுதலாக நேர்முகப் பரீட்சைக்கு அவர் அழைக்கப்படவில்லை எனில் அவரை மீண்டும் நேர்முகப்பரீட்சைக்கு அழைத்து தகைமைகளை பூர்த்தி செய்திருந்தால் ஆட்சேர்ப்பு செய்வதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state-

(i) whether he acknowledges that the limited competitive examination for the recruitment to Grade III of the Sri Lanka Principals' Service was held in the year 2015;

(ii) whether he is aware that interview was held in March 14, 15, 16, 17, 18, 19, 20 in the year 2015;

(iii) the basis of recruitment of persons who were recruited from the said interview;

(iv) whether he will submit the list of appointees to this House;

(v) whether he admits that the candidates who were not selected from the interview were given an opportunity to submit appeals; and

(vi) whether he is aware that 43 of them were granted appointments?

(b) Will he also state -

(i) whether he is aware that Mrs. S.K.K. Gunathilake who appeared for the interview under number 1487 and submitted an appeal was not called for the interview;

(ii) the reasons for not calling her for this interview; and

(iii) if she had not been called for the interview due to an oversight, whether action will be taken to call her for an interview again and take action to recruit her if she has fulfilled the qualifications?

(c) If not, why?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) ඔව්.

(ii) 2015 වර්ෂයේ මාර්තු 14, 15, 16, 17, 18, 19, 20 දිනවල සම්මුඛ පරීක්ෂණ පවත්වා නොමැති අතර, 2016 වර්ෂයේ මාර්තු 14, 15, 17, 18, 19 හා 20 යන දිනවල සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත.

(iii) අංක 1885/31 හා 2014.10.22 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවේ ඡේද අංක 7.2 අනුව බඳවා ගන්නා ලදී.

(iv) ඔව්. ඇමුණුම 01 බලන්න. (ඇමුණුම 01 **සභාගත*** කරමි.)

(v) එසේ අවස්ථාවක් ලබා දී නැත.

මෙම සම්මුඛ පරීක්ෂණයෙන් තේරී පත් නොවූ අයදුම්කරුවන් සඳහා අභියාචනා ඉදිරිපත් කරන ලෙස කැඳවීමක් සිදු කර නොමැති අතර, අභියාචනා සම්බන්ධයෙන් නැවත සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සඳහා සේවා ව්‍යවස්ථාව අනුව ප්‍රතිපාදන නොමැත.

(vi) පත්වීම් ලබා දී ඇත.

අයදුම්කරුගේ පාලනයෙන් බැහැර වූ කරුණු මත පළමු අවස්ථාවේදී පත්වීම් ලබා නොදුන් නමුත් අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරින් 43දෙනෙකුට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ අනුමැතිය අනුව පත්වීම් ලබා දී ඇත.

(ආ) (i) අභියාචනා ඉදිරිපත් කරන ලද කිසිදු අභියාචනාකරුවෙකු නැවත සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවීම් සිදු කර නැත. එබැවින් අංක 1487 යටතේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි එස්.කේ.කේ. ගුණතිලක මහත්මියටද එවැනි කැඳවීමක් සිදුකර නොමැත.

(ii) අංක 1885/31 හා 2014.10.22 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. සම්මුඛ පරීක්ෂණයෙන් තේරී පත් නොවූ නිලධාරින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් නැවත සම්මුඛ පරීක්ෂණ පවත්වා නොමැත.

(iii) උක්ත පැහැදිලි කළ පරිදි අතපසුවීමක් සිදුවී නොමැත. විදුහල්පති සේවා ව්‍යවස්ථානුකූලව විදුහල්පති සේවයේ III පත්වීමක් ලැබීමට අවශ්‍ය සුදුසුකම් හා බඳවා ගැනීමේ සුදුසුකම් සලකා බලන ලද 2015.01.01 දිනට මෙම නිලධාරිනිය සපුරා තිබූ සුදුසුකම් හා බඳවා ගැනීමට අවශ්‍ය නමුත් නිලධාරිනිය විසින් සපුරා නොමැති සුදුසුකම් පහත පරිදි වේ.

| බඳවා ගැනීමට අදාළ සුදුසුකම් | නිලධාරිනිය සතුව තිබූ සුදුසුකම් | 2015.01.01 දිනට නිලධාරිනිය විසින් සපුරා නොමැති සුදුසුකම් |
|---|---|---|
| විදුහල්පති සේවයේ III ශ්‍රේණියේ බඳවා ගැනීමේදී සේවා ව්‍යවස්ථාවේ ඡේද අංක 7.2.2.1 හා 7.2.2.2 (ඇමුණුම 02) අනුව කාණ්ඩ කිහිපයක් යටතේ අධ්‍යාපන සුදුසුකම් හා සේවා පළපුරුද්ද යටතේ සුදුසුකම් සලකා බලනු ලැබේ. ඒ අනුව මෙම නිලධාරිනියට අදාළව බඳවා ගැනීමට සපුරා තිබිය යුතු සුදුසුකම් පහත පරිදි වේ. (i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම විෂයය ක්ෂේත්‍රයක උපාධිය සමඟ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව හෝ ගුරු පුහුණු සහතිකය. | උපාධිය පමණකි. | ඡේද අංක 7.2.2.1 (ii)හි විධිවිධාන යටතේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයට බඳවා ගැනීමට අවශ්‍ය වන ගුරු පුහුණු සහතිකය හෝ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව නැත. |

ඒ අනුව එස්.කේ.කේ. ගුණතිලක මහත්මිය විදුහල්පති සේවා ව්‍යවස්ථානුකූලව මූලික සුදුසුකම් සපුරා නොමැති වීම මත ඇයට විදුහල්පති සේවයේ III ශ්‍රේණියේ පත්වීමක් ලබා දී නොමැත.

(ඇ) අදාළ නොවේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්න දෙකක් තිබෙනවා. මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මෙයයි. විද්‍යාලවල වැඩබලන විදුහල්පතිවරුන්, විදුහල්පතිවරුන් ලෙස පත් කිරීම සඳහා ඔබතුමා ගැසට් කරලා තිබෙනවා. මේ ගැසට් කිරීම තුළ පාසල් වර්ගීකරණය කරලා තිබෙනවා. මොන ආකාරයටද පාසල් වර්ගීකරණය කරන්නේ? ජාතික පාසල්වල, ඒ පාසලේ දරුවන් සංඛ්‍යාව අනුවද? එහෙම නැත්නම් ගුරුවරුන් ප්‍රමාණය අනුවද? ඒ සඳහා මොකක්ද ගත්ත ක්‍රියා පටිපාටිය?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, වැඩබලන විදුහල්පතිවරුන්ට වෙනම විභාගයක් තියලා නැහැ. අපි 2015දී ගැසට් කරලා III ශ්‍රේණියේ විදුහල්පතිවරුන් 4,000ක් සුදුසුකම් මත බඳවා ගත්තා, දේශපාලනය බිංදුවක්වත් සම්බන්ධ කරගන්නේ නැතිව. [බාධා කිරීමක්] ඉන්න, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා කියපු ආකාරයට තවත් විදුහල්පතිවරුන් 2,000ක් බඳවා ගන්න සම්මුඛ පරීක්ෂණ අවසන් කරලා තිබෙනවා. [බාධා කිරීමක්] මම ඔබතුමාට පැහැදිලි වෙන්නයි මේ කියන්නේ. ඒක කරුණු කිව්වොත් තමයි ඔබතුමාට සම්පූර්ණයෙන්ම පැහැදිලි වෙන්නේ. මෙවර ජාතික පාසල් සඳහා විදුහල්පතිවරුන් බඳවා ගැනීමේ දී අපි මුලින්ම රාජ්‍ය සේවා කොමිසමේ අධ්‍යාපන කමිටුවේ අනුමැතිය අරගෙන, නිර්ණායක මත ගැසට් කරලා ඒ බඳවා ගැනීම් කරන්න අවශ්‍ය සියලු කටයුතු

---
*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

කළා. එහිදී අපි නිපුණතාව පදනම් කරගෙන බඳවා ගන්නත් ප්‍රමුඛත්වය දුන්නා. IT කරලා තිබෙනවා නම්, වෙනත් භාෂාවක් ඉගෙන ගෙන තිබෙනවා නම් ඒවාට යම් ලකුණු ප්‍රමාණයක් දුන්නා. මීට කලින් විදුහල්පතිවරුන් බඳවා ගැනීමේ දී, සියයට 90ක් ලකුණු දුන්නේ වැඩ බලන විදුහල්පතිකම නිසා. වැඩබලන විදුහල්පතිවරුන් පත් කළේ දේශපාලනයෙන්. විදුහල්පතිකමක වැඩබලලා තිබෙනවා නම්, ඒකට ලකුණු 90ක් දුන්නා. විශේෂ ක්‍රියාකාරකම් හා පරිබාහිර ක්‍රියාකාරකම් කරලා තිබෙනවා නම් තව ලකුණු පහක් දුන්නා.

ලකුණු 100න්, ලකුණු 5යි අධ්‍යාපන සුදුසුකම්වලට දුන්නේ. නමුත් ඒ අයගේ නිපුණතාවට, විභාග සහතිකවලට -පශ්චාත් උපාධිය වෙන්න පුළුවන්, ඊට ඉහළ සුදුසුකමක් වෙන්න පුළුවන්- ලකුණු දීලා, තවත් නිර්ණායක හදලා තමයි ජාතික පාසල්වලට විදුහල්පතිවරු බඳවා ගන්න අපි තීරණය කළේ. නමුත්, රාජ්‍ය සේවා කොමිසමෙන් ඒක අත් හිටෙව්වා. ඇත්ත වශයෙන්ම ඒ ගොල්ලෝ ඒකට අනුමැතිය දීලා, ගැසට් එක පවා අනුමැතියට යවලා, ඊට පස්සේ ඒක නැවැත්තුවා. ඒකට හේතුව මොකක්ද කියන්න මම දන්නේ නැහැ. ඇමතිවරයා විධියට මම නම් ඒකට එකඟ නැහැ.

විදුහල්පතිවරු බඳවා ගන්න අපි දැන් ගැසට් කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වේ මීට කලින් පාසල් වර්ගීකරණය කළ ආකාරය. ඒ අනුව, ජාතික පාසල් 64ක් පළමු ශ්‍රේණියේ ජාතික පාසල් විධියට හඳුනාගෙන තිබෙනවා. ඒක පෙර circular එකකින් දැනුම් දීපු එකක් මිස, අපි වර්ගීකරණයක් කරලා දැනුම් දීපු එකක් නොවෙයි. ඒ පාසල් 64ට Class I අය අනුයුක්ත කරන්නත්, ඉතිරි ජාතික පාසල්වලට අනෙක් අය බඳවා ගන්නත් තමයි ගැසට් කර තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඒ වර්ගීකරණය අදට ගැළපෙන්නේ නැහැ. එය වෙනස් කරන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. මේ පාසල්වල ළමයි 2,500ක් - 3,000ක් ඉන්නවා, ගුරුවරු මෙපමණ ප්‍රමාණයක් ඉන්නවා, විභාග ප්‍රතිඵල ඉහළ මට්ටමක තිබෙනවා කියන වර්ගීකරණය තමයි එදා තිබුණේ. අදත් මේ පාසල්වලට විදුහල්පතිවරු බඳවා ගන්නේ ඒ අනුව නම්, ඒ වර්ගීකරණය ගැළපෙන්නේ නැහැ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඔබතුමා කියන කාරණයට මම එකඟයි. ඒ නිසා තමයි අපි එය නොසලකා පසුගිය වතාවේ ගැසට් කළේ. ඒ ජාතික පාසල් 64 circular එකකින් දැනුම් දීලා තිබෙන්නේ. ඒ පාසල් 64ත් නොතකා, නිපුණතාව මත -මේ වෙනස්කම් එක්ක- පොදුවේ විදුහල්පතිවරු බඳවා ගන්න හිතාගෙන තමයි අපි කටයුතු කළේ. නමුත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් නැවත කියනවා, නැහැ, ඒ පාසල් 64 ගැන බලලා ඒවාට Class I අය ලබා දෙන්න ඕනෑ කියලා. ඔබතුමා ඉන්න මතයේ තමයි මාත් ඉන්නේ, ගරු මන්ත්‍රීතුමනි. නමුත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව එසේ කියා තිබෙන නිසා මට ඊට වඩා තීරණයක් ගන්න බැහැ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මේ විද්‍යාලවල අවුරුදු 15ක්, 20ක් විදුහල්පතිවරු ලෙස සිටි සමහර අය, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III, II හා I ශ්‍රේණිවලට පත් වෙලා, ඊට පස්සේ පරිපාලන සේවා තරග විභාගයෙනුත් සමත් වෙලා තිබෙනවා. ඒ ගොල්ලෝ අවුරුදු 15ක් විතර විදුහල්පතිවරු හැටියට ඉඳලාත් තිබෙනවා. නමුත් මේ ගැසට් එක අනුව ඒ විශේෂ cadre එකේ - general cadre එක නොවෙයි, විශේෂ cadre එකේ- කිසි කෙනෙකුට විදුහල්පතිකමට අයදුම්පතක් ඉදිරිපත් කරන්න බැහැ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඇත්තෙන්ම මාත් එය පිළිගන්නවා. නමුත්, මට කරන්න දෙයක් නැහැ. මම ඒ කරුණ පැහැදිලි කළා. අමාත්‍යාංශය විධියට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන කමිටුවට මම මේ ගැන කිව්වා. ඊට පස්සේ පාර්ලිමේන්තුවටත් දන්වා, ගරු අගමැතිතුමාත් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළා. නමුත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව මේකට එකඟතාව දෙන්නේ නැහැ. ඒ නිසා තමයි අපට මේ කටයුත්ත කර ගන්න බැරි වුණේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ ගැන අවධානය යොමු කරන්නම්.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු කථානායකතුමනි,- [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්න තුනක් විතර ඇහුවා නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු කථානායකතුමනි, මේ කාරණය මා ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ස්වාධීන කොමිෂන් සභා පත් කළා නේ. දැන් ඔබතුමාට තේරෙනවා ඇති, ඒ කොමිෂන් සභාවලින් ගන්නා තීන්දු මොන වාගේද කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන මම අවධානය යොමු කරලා තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගන්න තීරණ ඇමතිතුමාටවත් වෙනස් කරන්න බැහැ; කිසි කෙනෙකුට වෙනස් කරන්න බැහැ. ඒ නිසා සාධාරණය ඉෂ්ට කරන්න බැරි වෙලා තිබෙනවා. ස්වාධීන කොමිෂන් සභා පත් කරලා, අපි මේ කටයුතු තවත් අවුල් කර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## කූරගල පුරාවිද්‍යාත්මක ස්ථානය : සංරක්ෂණය
## கூரகல தொல்பொருளியல் இடம்: பாதுகாத்தல்
## KURAGALA ARCHAEOLOGICAL SITE: PRESERVATION

4/'18

**1. ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා (ගරු හේෂා විතානගේ මහතා වෙනුවට)**

(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன - மாண்புமிகு ஹேசா விதானகே சார்பாக)

(The Hon. Anura Sidney Jayarathne on behalf of the Hon. Hesha Withanage)

නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) කූරගල පුරාවිද්‍යාත්මක ස්ථානය සංරක්ෂණය කිරීම සඳහා මේ වනවිට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணத்துறை மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) கூரகல தொல்பொருளியல் இடத்தைப் பேணிப் பாதுகாப்பதற்காக அரசாங்கம் இதுவரையில் எடுத்துள்ள நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Cultural Affairs:

(a) Will he inform this House of the action that has been taken by the Government by now to preserve the Kuragala archaeological site?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க)

(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) ඔව්.

කූරගල පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණය කර පවත්වාගෙන යාම සඳහා පහත පරිදි කටයුතු යොදා ඇත.

- කූරගල පුරාවිද්‍යා ස්ථානයේ පැවති අනවසර ඉදිකිරීම් (විශ්‍රාම ශාලා 02ක්, කඩ 03ක්, මුස්ලිම් පල්ලියට අයත් ශාලා ගොඩනැඟිලි 04ක්, වැසිකිළි 06ක් හා කොඩි කණු 02ක්) සියල්ල මේ වන විට ඉවත් කර ඇති අතර, ප්‍රධාන මුස්ලිම් පල්ලිය සහිත ගොඩනැඟිල්ල හා සොහොන් කොත් පමණක් භූමිය තුළ ඉවත් කිරීමට ඉතිරිව ඇත. තවද මෙම ඉවත් විය යුතු ගොඩනැඟිල්ල සහ සොහොන් කොත් සඳහා වෙනත් ඉඩකඩ සහිත ඉඩමක් ඔවුන් වෙත ලබා දී ඇත.

- මායිම් කණු යොදා පුරාවිද්‍යා මායිම් නිරවුල් කර (අක්කර 52, රූඩ් 02, පර්චස් 19ක බිම් ප්‍රමාණය) මෙම භූමිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යනු ලබයි.

- ගල්ලෙන් ආශ්‍රිත භූමිය සහ කාර්යාලය ආශ්‍රිත භූමිය සෝදා යාම වැළැක්වීමට ගල්වැටි යොදා භූමිය සකස් කර පවත්වාගෙන යනු ලබයි.

- ප්‍රදර්ශිත දාගැබ වෙත ළඟා වීමට පඩි බැඳ මාර්ගය සකස් කර ඇත.

- ප්‍රදර්ශිත දාගැබේ කඩතොලු වී තිබූ ස්ථාන බැමි බැඳ, පොයින්ට් කර සංරක්ෂණය කර ඇත.

- ප්‍රදර්ශිත දාගැබ වටා ඇති වැට සකස් කර තීන්ත ආලේප කර ඇත.

- ජලය සහ විදුලිය පුරාවිද්‍යා ස්ථානය වෙත ලබාගෙන ඇත.

- මේ වන විට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවකයින් සහ පුරාවිද්‍යා දෙපර්තමේන්තුවේ සේවකයින් විසින් පුරාවිද්‍යා ස්ථානයක් ලෙස හොඳින් පවත්වාගෙන යනු ලබයි. ඒ සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් පුරාවිද්‍යා සහායක දෙදෙනෙක්, මුරකරුවන් දෙදෙනෙක් සහ නිලධාරින් එක් අයෙකු සේවයේ යොදවා ඇත.

(ආ) අදාළ නොවේ.

## ලිපි සඳහා තැපැල් ගාස්තු ඉහළ දැමීම: විස්තර
## கடிதங்களுக்கான தபால் கட்டண அதிகரிப்பு: விபரம்
## INCREASE OF POSTAL CHARGES FOR LETTERS: DETAILS

428/'19

**5. ගරු මහින්ද අමරවීර මහතා (ගරු කනක හේරත් මහතා වෙනුවට)**

(மாண்புமிகு மஹிந்த அமரவீர - மாண்புமிகு கனக ஹேரத் சார்பாக)

(The Hon. Mahinda Amaraweera on behalf of the Hon. Kanaka Herath)

තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වනවිට ලිපි සඳහා තැපැල් ගාස්තු වැඩිකර තිබේද;

(ii) එසේ නම්, ඒ කොපමණ ප්‍රමාණයකින්ද;

(iii) මෙම තැපැල් ගාස්තු වැඩි කිරීම සම්බන්ධයෙන් පොදු මහ ජනතාව දැනුවත්කර තිබේද;

(iv) එසේ නම්, එම දැනුම්දීම සිදු කරන ලද ආකාරය සහ මාධ්‍යය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

தபால் சேவைகள், முஸ்லிம் சமய விவகார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் கடிதங்களுக்கான தபால் கட்டணங்கள் அதிகரிக்கப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், அத்தொகை யாதென்பதையும்;

(iii) மேற்படி தபால் கட்டண அதிகரிப்பு தொடர்பாக பொது மக்கள் அறிவுறுத்தப்பட்டுள்ளார்களா என்பதையும்;

(iv) ஆமெனில், மேற்படி அறிவுறுத்தல் மேற்கொள்ளப்பட்ட விதம் மற்றும் ஊடகம் யாது என்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු මහින්ද අමරවීර මහතා]

asked the Minister of Postal Services and Muslim Religious Affairs:

(a) Will he inform this House-

(i) whether postal charges for letters have been increased by now;

(ii) if so, the amount by which postal charges have been increased;

(iii) whether the public was made aware of this increase in postal charges; and

(iv) if so, the method in which it was done and the media used for this purpose?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ග්‍රෑම් 20ක් බරැති සාමාන්‍ය ලිපියක තැපැල් ගාස්තුව රුපියල් 10.00 සිට රුපියල් 15.00 දක්වා ඉහළ දමා ඇති අතර, ග්‍රෑම් 20ක් බරැති විවෘත ලිපියක තැපැල් ගාස්තුව රුපියල් 7.00 සිට රුපියල් 12.00 දක්වා ඉහළ දමා ඇත.

(iii) තැපැල් ගාස්තු වැඩි කිරීම සම්බන්ධයෙන් පොදු මහ ජනතාව දැනුවත් කර තිබේ.

(iv) මුද්‍රිත මාධ්‍ය ඔස්සේ - සිංහල නිවේදනය - දිනමිණ පුවත් පත (2018.07.02 දින)

- දෙමළ නිවේදනය - තිනකරන් පුවත් පත (2018.07.02 දින)

- ඉංග්‍රීසි නිවේදනය - ඩේලි නිවුස් පුවත් පත (2018.07.02 දින)

විද්‍යුත් මාධ්‍ය ඔස්සේ - www.slpost.gov.lk වෙබ් අඩවිය.

(ආ) අදාළ නොවේ.

## ජනවසම ප්‍රධාන කාර්යාලය පිහිටි ගොඩනැඟිල්ලේ කොටස් බදු දීම: විස්තර

### மக்கள் தோட்ட அபிவிருத்திச் சபையின் தலைமையகத்தின் ஒரு பகுதியைக் குத்தகைக்கு விடல்: விபரம்

### LEASE OF PARTS OF BUILDING HOUSING JEDB HEAD OFFICE: DETAILS

480/'19

**6. ගරු මහින්ද අමරවීර මහතා (ගරු ජයන්ත සමරවීර මහතා වෙනුවට)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - மாண்புமிகு ஜயந்த சமரவீர சார்பாக)
(The Hon. Mahinda Amaraweera on behalf of the Hon. Jayantha Samaraweera)

රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ, ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැඟිල්ලේ කොටස් බදු පදනම මත ලබා දී ඇති රාජ්‍ය ආයතන කවරේද;

(ii) එම ගොඩනැඟිල්ලේ බදු දී ඇති වර්ග ප්‍රමාණය, බදු කාලය සහ බදු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ආයතන, අදාළ බදු කාලය සඳහා අය විය යුතු මුදල් සම්පූර්ණයෙන්ම ගෙවා තිබේද;

(iv) නො එසේ නම්, ඒ සම්බන්ධයෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලය ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

அரச தொழில் முயற்சிகள், மலைநாட்டு மரபுரிமைகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மக்கள் தோட்ட அபிவிருத்திச் சபையின், தலைமையகம் இயங்குகின்ற கட்டடத்தின் பங்குகள் குத்தகை அடிப்படையில் வழங்கப் பட்டுள்ள அரச நிறுவனங்கள் யாவை என்பதையும்;

(ii) அக் கட்டடத்தில் குத்தகைக்கு வழங்கப்பட்டுள்ள சதுர அடியின் அளவு, குத்தகை காலம் மற்றும் குத்தகைத் தொகை வெவ்வேறாக எவ்வள வென்பதையும்;

(iii) மேற்படி நிறுவனங்கள் ஏற்புடைய குத்தகைக் காலத்துக்கு அறவிடப்பட வேண்டிய தொகை யினை முழுமையாக செலுத்தி முடித்துள்ளனவா என்பதையும்;

(iv) இன்றேல், அது தொடர்பாக மக்கள் தோட்ட அபிவிருத்திச் சபையினால் மேற்கொள்ளப்பட்ட நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Enterprise, Kandyan Heritage and Kandy Development:

(a) Will he inform this House -

(i) the public institutions to which parts of the building in which the Head Office of the Janatha Estate Development Board is housed have been given on lease;

(ii) the floor area that has been given on lease, the period of lease and the lease amount, separately;

(iii) whether the amounts due for the relevant period of lease have been completely paid by the aforesaid institutions; and

(iv) if not, the action that has been taken by the Janatha Estate Development Board in that regard?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කිසිදු රාජ්‍ය ආයතනයකට බදු දී නොමැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

## ලංකා පොස්පේට් සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා : වැටුප් සහ දීමනා
## இலங்கை பொஸ்பேட் கம்பனியின் நிறைவேற்றுப் பணிப்பாளர்: சம்பளம் மற்றும் படிகள்
WORKING DIRECTOR OF LANKA PHOSPHATE COMPANY LIMITED: SALARY AND ALLOWANCES

625/'18

**11.ගරු මහින්ද අමරවීර මහතා (ගරු ශෙහාන් සේමසිංහ මහතා වෙනුවට)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - மாண்புமிகு ஷெஹான் சேமசிங்க சார்பாக)
(The Hon. Mahinda Amaraweera on behalf of the Hon. Shehan Semasinghe)

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා සීමාසහිත ලංකා පොස්පේට් සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළ අයගේ නම කවරේද;

(ii) ඔහුට හිමි නිලරථ සංඛ්‍යාව, ඉන්ධන දීමනාව, වැටුප් හා දීමනා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා ඔහුට ගෙවා ඇති සම්පූර්ණ ගෙවීම් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) අනුමත ගෙවීම්වලට අමතරව වෙනත් ගෙවීම් කර තිබේද;

(ii) එසේ නම්, ගෙවා ඇති මුදල කොපමණද;

(iii) එම ගෙවීම් සඳහා අනුමතිය ලබාදුන්නේ කවුරුන් විසින්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015 ஆம் ஆண்டிலிருந்து இன்று வரை வரையறுக்கப்பட்ட இலங்கை பொஸ்பேட் கம்பனியின் நிறைவேற்றுப் பணிப்பாளரின் பெயர் என்ன என்பதையும்;

(ii) இவருக்குரிய உத்தியோகபூர்வ வாகனம், எரிபொருள் கொடுப்பனவு, சம்பளம் மற்றும் படிகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) 2015 ஆம் ஆண்டிலிருந்து இன்று வரை இவருக்குச் செலுத்தப்பட்டுள்ள மொத்தக் கொடுப்பனவு யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) அங்கீகரிக்கப்பட்ட கொடுப்பனவுகளுக்கு மேலதிகமாக வேறு கொடுப்பனவுகள் செலுத்தப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், செலுத்தப்பட்டுள்ள மொத்தத் தொகை யாது என்பதையும்;

(iii) மேற்படி கொடுப்பனவுகளுக்காக யாரால் அங்கீகாரம் வழங்கப்பட்டது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Rural Economic Affairs, Irrigation and Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House-

(i) the name of the Working Director of Lanka Phosphate Company Limited from the year 2015 to date;

(ii) separately, the number of official vehicles, fuel allowance, salary and allowances granted to him; and

(iii) the total payments that have been made to him from the year 2015 to date?

(b) Will he also inform this House-

(i) whether payments outside the approved amounts have been made to him;

(ii) if so, the amount paid thus; and

(iii) the person who has granted approval for the said payments?

(c) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රියාකාරී අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු (03) රාජකාරි කටයුතු කර ඇත.

01. ආර්.ඇන්.කේ. රණවීර මහතා (2015.02.20 සිට 2018.07.04 දක්වා)

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

02. චමින්ද කුමාර දිසානායක මහතා (2018.07.04 සිට 2018.12.20 දක්වා)

03. ඩී.යූ. ජයවර්ධන මහතා (2019.04.10 සිට මේ දක්වා)

(ii) (අ) හිමි නිල රථ ගණන - 01

(ආ) අනුමත ඉන්ධන දීමනාව—මාසිකව ඉන්ධන ලීටර් 150

(ඇ) වැටුප

දීමනා (මාසිකව)

I. මාසික වැටුප් දීමනාව - රුපියල් 65,000.00

II. නිෂ්පාදනය මත පදනම් වූ දීමනාව (සාමාන්‍ය අගය රුපියල් 36,564.00

III. සංග්‍රහ වියදම් - රුපියල් 10,000.00

IV. ඉන්ධන දීමනාව/වියදම - රුපියල් 41,448.00

දීමනා (වාර්ෂිකව) - 2018

I. ප්‍රසාද දීමනාව - රුපියල් 13,500.00

II. වාර්ෂික දීමනාව - රුපියල් 185,996.51

III. නිල ඇඳුම් සහ පාවහන් දීමනාව - රුපියල් 21,874.80

(iii) ඔව්.

2015 සිට මේ දක්වා සේවය කළ ක්‍රියාකාරි අධ්‍යක්ෂවරුන් තිදෙනාට ගෙවා ඇති සම්පූර්ණ ගෙවීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | නම | කාලය | මුදල රුපියල් |
|---|---|---|---|
| 01. | ආර්.ඇන්.කේ. රණවීර මහතා | (2015.02.20 සිට 2018.07.04 දක්වා) | 6,603,680.12 |
| 02. | චමින්ද කුමාර දිසානායක මහතා | (2018.07.04 සිට 2018.12.20 දක්වා) | 605,694.93 |
| 03. | ඩී.යූ. ජයවර්ධන මහතා | (2019.04.10 සිට 2019.06.30 දක්වා) | 348,671.78 |
| | එකතුව | | 7,558,046.83 |

(ආ) (i) ඔව්.

සංග්‍රහ වියදම් වශයෙන් සෑම මසකම ආර්.ඇන්.කේ. රණවීර මහතාට පමණක් රුපියල් 10,000ක දීමනාවක් අනුමත ගෙවීම්වලින් බැහැරව වූ දීමනාවක් ලෙස ගෙවා ඇත.

(ii) රුපියල් 401,000.00කි.

(iii) ඔව්.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත.

(ඇ) අදාළ නැත.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 13 -763/'19- (1), ගරු සුසන්ත පුංචිනිලමේ මහතා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු කථානායකතුමනි, ගරු සුසන්ත පුංචිනිලමේ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ පානීය ජල ව්‍යාපෘති: විස්තර

குருநாகல் மாவட்ட குடிநீர் கருத்திட்டங்கள்: விபரம்
DRINKING WATER PROJECTS IN KURUNEGALA DISTRICT: DETAILS

771/'19

**14.ගරු මහින්ද අමරවීර මහතා (ගරු ශාන්ත බණ්ඩාර මහතා වෙනුවට)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - மாண்புமிகு சாந்த பண்டார சார்பாக)
(The Hon. Mahinda Amaraweera on behalf of the Hon. Shantha Bandara)

නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ උග්‍ර පානීය ජල ගැටලුවක් පවතින බව පිළිගන්නේද;

(ii) ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වන ප්‍රධාන පානීය ජල ව්‍යාපෘති කවරේද;

(iii) පොල්ගහවෙල, පොතුහැර, අලව්ව ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බව දන්නේද;

(iv) එසේ නම්, එමගින් ආවරණය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(v) එම ව්‍යාපෘති කාර්යයන් කඩිනම් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல், நீர்வழங்கல் மற்றும் உயர்கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குருநாகல் மாவட்டத்தில் உக்கிர குடிநீர் பிரச்சினை காணப்படுகின்றது என்பதை அவர் ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(ii) அதற்காக அமுல்படுத்தப்பட்டுள்ள பிரதான குடிநீர் கருத்திட்டங்கள் யாவை என்பதையும்;

(iii) பொல்கஹவெல, பொத்துஹெர, அளவ்வ நீர் கருத்திட்டம் அமுல்படுத்தப் பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(iv) ஆமெனில், அதன் கீழ் உள்ளடங்கும் பிரதேச செயலாளர் பிரிவுகள் யாவை என்பதையும்;

(v) மேற்படி கருத்திட்டப் பணிகளை துரிதப்படுத்த நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of City Planning, Water Supply and Higher Education:

(a) Will he inform this House-

(i) whether he admits that a severe drinking water problem prevails in Kurunegala District;

(ii) the major drinking water projects implemented to address that;

(iii) whether he is aware of the fact that Polgahawela, Pothuhera, Alawwa Water Project is in operation;

(iv) if so, the Divisional Secretaries' Divisions covered by that; and

(v) whether steps will be taken to accelerate the work of those project functions?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ප්‍රධාන පානීය ජල ව්‍යාපෘති ගණන 14කි.

මින් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති ගණන 03කි.

1. අලව්ව, පොල්ගහවෙල, පොතුහැර ඒකාබද්ධ ජලසම්පාදන ව්‍යාපෘතිය
2. දැදුරු ඔය ජලසම්පාදන ව්‍යාපෘතිය
3. ගලගෙදර - මාවතගම ජලසම්පාදන ව්‍යාපෘතිය

පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යෝජිතව ඇත.

1. බිංගිරිය, උඩුබද්දාව ජලසම්පාදන ව්‍යාපෘතිය
2. කටුපොත - බමුණාකොටුව, පඬුවස්නුවර ජලසම්පාදන ව්‍යාපෘතිය
3. මාකඳුර - පන්නල - කුලියාපිටිය ජලසම්පාදන ව්‍යාපෘතිය
4. කුරුණෑගල උතුරු නගර ජලසම්පාදන ව්‍යාපෘතිය
5. ගල්ගමුව ජලසම්පාදන ව්‍යාපෘතිය
6. මැල්සිරිපුර ජලසම්පාදන ව්‍යාපෘතිය
7. රස්නායකපුරට ජල දිගුව ජලසම්පාදන ව්‍යාපෘතිය
8. ඇහැටුවැව අඹන්පොල ජලසම්පාදන ව්‍යාපෘතිය
9. ගිරිඋල්ල දඹදෙණිය, නාරම්මල ජලසම්පාදන ව්‍යාපෘතිය
10. වීරඹුගෙදර ජලසම්පාදන ව්‍යාපෘතිය
11. පොල්පිතිගම ජලසම්පාදන ව්‍යාපෘතිය

(iii) ඔව්.

(iv)
1. පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - ග්‍රාම නිලධාරි වසම් 82න් 80ක්
2. අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - ග්‍රාම නිලධාරි වසම් 66න් 54ක්
3. මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - ග්‍රාම නිලධාරි වසම් 45න් 16ක්
4. කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - ග්‍රාම නිලධාරි වසම් 54න් 16ක්

(ආවරණය වන ග්‍රාම නිලධාරි වසම් ඇමුණුම් 1** මඟින් දක්වා ඇත)

(v) ඔව්. ව්‍යාපෘති කාර්යයන් කඩිනම් කිරීමට ගෙන ඇති පියවරයන් පහත සඳහන් පරිදි වේ.

- ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීම හා අනුමැතිය ලබා ගැනීම් කඩිනමින් නිමකර ඇත.
- ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා අවශ්‍ය පාරිසරික අනුමැතීන් ලබාගෙන ඇත.
- මේ වන විට ඉදිකිරීම් ආරම්භ කර ඇති අතර සමස්ත ප්‍රගතිය සියයට 46ක් වේ.
- ජල නළ එළීමට නියමිත සියලු මාර්ග සඳහා අදාළ ආයතනයන්ගෙන් අනුමැතිය ලබාගෙන ඇත.
- ප්‍රධාන සම්ප්‍රේෂණ නළ එළීම ආරම්භ කර ඇති අතර එහි ප්‍රගතිය සියයට 36ක් වේ.
- බෙදාහැරීමේ පද්ධතියේ ඉදිකිරීම් සඳහා අවශ්‍ය ජල නළ මේ වන විට ඇණවුම් කර ඇති අතර එයින් කොටසක් ව්‍යාපෘතියට ලැබී ඇත.
- මෙම ව්‍යාපෘතිය 2020 මාර්තු මාසයේදී නිම කිරීමට යෝජිතය.

(ආ) අදාළ නොවේ.

අදාළ ඇමුණුම සභාගත* කරමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න. ප්‍රථමයෙන්, ගරු අනුර දිසානායක මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### පොලිස් නිලධාරින්ට සංයුක්ත දීමනාව ලබා දීම
### பொலிஸ் உத்தியோகத்தர்களுக்கு இணைந்த கொடுப்பனவு வழங்கல்
### GRANT OF COMBINED ALLOWANCE TO POLICE OFFICERS

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරින්ට අදාළ සංයුක්ත දීමනා පොරොන්දු වූ පරිදි නොගෙවීම හේතුවෙන් පැන නැඟී ඇති ගැටලුව පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

ගරු කථානායකතුමනි, සියලු රාජ්‍ය සේවකයන්ට අදාළ වන පරිදි, 2018.08.23වන දින සිට වැටුප් වැඩි වීමට අනුකූලව සංයුක්ත දීමනා වැඩි කරනු ලැබ තිබුණා. රජයේ අනෙකුත්

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අනුර දිසානායක මහතා]

අංශවල නිලධාරින්ට මෙම නව චක්‍රලේඛයට අදාළව සංයුක්ත දීමනා ගණනය කර ගමන් වියදම් දීමනා ගෙවනු ලැබ තිබුණද, ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරින්ට එය ලබාදීම අත්හිටුවා තිබීම පිළිබඳව 2019 ජනවාරි 24වන දින ස්ථාවර නියෝග 27 (2) යටතේ මා විසින් ප්‍රශ්න කරනු ලැබුවා. ගරු කථානායකතුමනි, මා නැවතත් ඒ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ, එදා සභානායකවරයා ලබාදුන් පිළිතුර පරිදි එය ක්‍රියාත්මක නොවීම නිසායි.

එහිදී, 2018 අගෝස්තු 09 වැනි දින චක්‍රලේඛයට අනුකූලව වැටුප් වැඩි වීමට අනුකූලව වැඩි කරන ලද සංයුක්ත දීමනා පොලිස් නිලධාරින්ට ලබාදීම සාධාරණ නොවන්නේද යන්නත්,

ඒ අනුව මෙම ගමන් වියදම් දීමනාව පොලිස් නිලධාරින්ට ලබාදීමට කටයුතු කරන්නේද යන්නත්, 2018 අගෝස්තු මාසයේ සිට ඔවුන්ට හිමි විය යුතු දීමනාවට අදාළ හිඟ මුදල් ගෙවීමට කටයුතු කරන්නේද යන්නත් මා විසින් විමසනු ලැබුවා.

මොකද, ඔවුන් රාජ්‍ය සේවයේ නිලධාරින්. විශේෂයෙන්ම අපි දන්නවා, ඔවුන් ඉතාම දුෂ්කර රැකියාවක නිරතවන කණ්ඩායම් බව. ඔවුන්, අයිතිවාසිකම් පිළිබඳව හඬ නඟන්න, අයිතිවාසිකම් පිළිබඳව උද්ඝෝෂණය කරන්න, අයිතිවාසිකම් පිළිබඳව strike කරන්නවත් පුළුවන් කණ්ඩායමක් නොවෙයි. ගරු කථානායකතුමනි, අඩුම තරමින් එවැනි කණ්ඩායම් පිළිබඳවවත් ආණ්ඩුව කරුණු සොයා බලා විමසිය යුතුව තිබෙනවා.

මා මේ ප්‍රශ්නය විමසූ අවස්ථාවේදී, අදාළ ඇමතිවරයා වෙනුවෙන් 2019 ජනවාරි 24වන දා ඊට පිළිතුරු දුන් සභානායකතුමා, චක්‍රලේඛ අනුව 2018.08.23වන දා සිට පොලිස් නිලධාරින්ට සංයුක්ත දීමනාව ලබා දීම සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති බවත්, 2018.08.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2018හි අවශ්‍යතා සම්පූර්ණ කරන්නේ නම් පොලිස් නිලධාරින්ටද එම චක්‍රලේඛයට අනුව සංයුක්ත දීමනාව ගෙවීමට බාධාවක් නොමැති බවත් ප්‍රකාශ කළා.

ගරු සභානායකතුමනි, ඔබතුමාට මතක ඇති, ඔබතුමා මෙම කාරණය පිළිගන්නා බවත්, ඔවුන්ට එය ලබා දිය යුතු බවත්, ඒ සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබෙන බවත් ජනවාරි මාසයේදී මේ පාර්ලිමේන්තුවට ප්‍රකාශ කළ බව. දැන් අගෝස්තු මාසයත් එළඹ තිබෙනවා. ඒ කියන්නේ, මාස 8කට ආසන්න කාලයක් ගත වී තිබෙනවා. ඔක්තෝබර් 26වන දා සිට දෙසැම්බර් 12 දක්වා, මාස දෙකකට ආසන්න කාලයක් ආණ්ඩුව නැතිව සිටි නිසා -මෙය ඔබතුමා හැම වෙලාවේම කියන දෙයක්.- මෙම කටයුත්ත ප්‍රමාද වූ බවත්, ඉතාම ඉක්මනින් ඔවුන්ට මෙම දීමනාව ලබා දිය යුතු යයි විශ්වාස කරන බවත් එහිදී තවදුරටත් කරුණු පැහැදිලි කරමින් ඔබතුමා කියා සිටියා, ගරු සභානායකතුමනි. ඒක කියලාත් දැන් මාස 8ක් ගත වෙලා තිබෙනවා. නමුත් තවමත් තමුන්නාන්සේලාට ඒක කරන්න බැරි වී තිබෙනවා.

කෙසේ වුවද, මේ දක්වා එම වැඩි කළ දීමනාවලට අනුව ගෙවීම් සිදු කර නොමැති බවත්, දැනටද එම නිලධාරින්ට ලැබෙන්නේ ලැබිය යුතු මුදලින් අඩක් බවත් දැන ගන්නට තිබෙනවා.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට අදාළ අමාත්‍යවරයා විසින් පිළිතුරු ලබා දෙනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

1. 2018.08.23වන දින සිට වැඩි කළ සංයුක්ත දීමනා සහිත ගමන් වියදම් දීමනාව පොලිස් නිලධාරින්ට ලබා දීමට කටයුතු කරන්නේද?
2. ඉදිරිපත් කරන ලද බව ප්‍රකාශ කළ කැබිනට් පත්‍රිකාවට කුමක් සිදුවීද? එය කඩිනමින් සම්මත කොට ඉදිරිපත් කරනු ලබන්නේද?
3. 2018 අගෝස්තු මාසයේ සිට ඔවුන්ට හිමි විය යුතු දීමනාවට අදාළ හිඟ මුදල් ගෙවීමට කටයුතු කරන්නේද?
4. මෙම අසාධාරණය ඉවත් කිරීම සඳහා ආණ්ඩුව තවත් කොපමණ කාලයක් ගත කරනවාද, ඉක්මනින්ම එය ලබා දීමට කටයුතු කරනවාද කියාත් මා දැන ගන්නට කැමතියි.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සභානායකතුමනි, එතුමාගේ ප්‍රශ්නයට පිළිතුරක් ලබාදෙනවාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

අදාළ අමාත්‍යවරයා ඉදිරි දිනකදී මේ ප්‍රශ්නයට පිළිතුරු ලබාදෙයි, ගරු කථානායකතුමනි. මම එක කාරණයක් කියන්න ඕනෑ. මෙම දීමනාව ලබාදිය යුතුය කියන මතයේ තමයි ආණ්ඩුව ඉන්නේ. රජය එම දීමනාව ලබා දීමට කැමැතිවෙලා තිබෙනවා. මම හිතන විධියට ප්‍රශ්නය තිබෙන්නේ මුදල් අමාත්‍යාංශය පැත්තෙන්, ගරු කථානායකතුමනි. මේ ප්‍රශ්නය අදාළ අමාත්‍යවරයාට යොමු කර උත්තරයක් ලබා දෙන්නම්. I am sympathetic towards them; ඔවුන්ට මෙම දීමනාව ලබාදෙනවාට අප හදවතින්ම එකඟයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ආණ්ඩුවට මෙය ලබා දීම පිළිබඳව ප්‍රශ්නයක් නැහැ කියා ගරු සභානායකතුමා කියනවා. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ මුදල් අමාත්‍යාංශය පැත්තෙන්ය කියාත් එතුමා කියනවා. එතකොට මුදල් අමාත්‍යාංශය ආණ්ඩුවේ කොටසක් නොවෙයිද? මම ඉස්සර වෙලාම අන්න ඒ කාරණය දැන ගන්නට කැමතියි.

ගරු සභානායකතුමනි, ඔබතුමා මට කනගාටුව පළ කිරීමෙන් කිසි පලක් නැහැ. මේ අදාළ නිලධාරින්ට මෙම දීමනාව මෙපමණ කාලයක් ලබා දීමට නොහැකිවීම පිළිබඳව කනගාටු වන බවත්, එම නිසා මෙම දීමනාව ඉතා ඉක්මනට ලබා දීමට කටයුතු කරන බවත් ඔවුන්ට පැවසීමයි වඩාත් යෝග්‍ය කියන එක තමයි මම කල්පනා කරන්නේ.

## II

## ජනාධිපති ජංගම සේවයේදී ජාතික හැඳුනුම්පත් නොමිලේ අයදුම් කළ පුද්ගලයන්

ஜனாதிபதி நடமாடும் சேவையில் இலவசமாக தேசிய அடையாள அட்டையைப் பெற விண்ணப்பித்தோர்

APPLICANTS FOR FREE NATIONAL IDENTITY CARDS AT PRESIDENTIAL MOBILE SERVICE

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, உள்ளக, உள்நாட்டலு வல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்

கௌரவ வஜிர அபேவர்தன அவர்களிடம் கேள்வி கேட்க அனுமதித்ததற்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

ஜனாதிபதியின் உத்தியோகப் பணி - 'நில மெஹெவர' நடமாடும் சேவையானது 2018 செப்ரெம்பர், 28ஆம் திகதி யாழ்ப்பாணம், சாவகச்சேரி, டிறிபேக் கல்லூரியில் நடை பெற்றது. இந்த நிகழ்வின்போது, பொதுமக்கள் இலவசமாக தேசிய அடையாள அட்டையைப் பெறலாம் என்றும், அடையாள அட்டைக்கான செலவுகளைத் தனது அமைச்சு ஆட்பதிவுத் திணைக்களத்திற்கு வழங்கும் என்றும் உள்நாட்டலுவல்கள் அமைச்சரினால் அறிவிக்கப்பட்டதாகவும், இதனை நம்பிய சாவகச்சேரி, ஊர்காவற்றுறை, சங்கானை, பருத்தித்துறை, நெடுந்தீவு, காரைநகர், நல்லூர் பிரதேச செயலகப் பிரிவுகளில் வாழ்கின்ற எமது மக்களில் பலரும் தேசிய அடையாள அட்டைக்கு விண்ணப்பித்து, தற்போது கிட்டத்தட்ட 11 மாதங்கள் ஆகின்ற நிலையிலும் இதுவரையில் தேசிய அடையாள அட்டைகள் கிடைக்கவில்லையெனத் தெரிவிக்கின்றனர். இந்த வகையில், சாவகச்சேரி பிரதேச செயலகப் பிரிவில் மாத்திரம் சுமார் 700 பேர் விண்ணப்பித்துள்ளதாகவும், ஏனைய ஒவ்வொரு பிரதேச செயலகப் பிரிவிலும் தலா 500 பேர் வரையில் விண்ணப்பித்துள்ளதாகவும் தெரிய வருகின்றது.

இதேநேரம், யாழ்ப்பாண மாவட்டத்தில் யாழ்ப்பாணம், கோப்பாய், தெல்லிப்பளை போன்ற பிரதேச செயலகப் பிரிவுகளில் மேற்படி நடமாடும் சேவை இடம்பெற்றிருந் தபோது, பொதுமக்கள் மற்றும் பொது அமைப்புக்களிடமிருந்து பணம் பெறப்பட்டு விண்ணப்பிக்கப்பட்டிருந்த தேசிய அடை யாள அட்டைகளுக்கான செலவுகள் செலுத்தப்பட் டதாகவும், இந்த விண்ணப்பதாரிகளுக்குரிய தேசிய அடையாள அட்டைகள் கிடைக்கப்பெற்றுவிட்டதாகவும் உள்நாட்டலு வல்கள் அமைச்சர் இந்த நிகழ்வுகளில் கலந்துகொள்ள வில்லையென்றும் கூறப்படுகின்றது.

எனவே,

01. ஜனாதிபதி நடமாடும் சேவையின்போது பணம் செலுத்தாது தேசிய அடையாள அட்டைக்கு விண்ணப்பித்துள்ள சாவகச்சேரி, ஊர்காவற்றுறை, சங்கானை, பருத்தித்துறை, நெடுந்தீவு, காரைநகர், நல்லூர் பிரதேச செயலகப் பிரிவுகளிலுள்ள மக்களுக்கான தேசிய அடையாள அட்டைகளை இலவசமாக வழங்கக்கூடிய சாத்தியப்பாடுகள் உண்டா?

02. தேசிய அடையாள அட்டைகள் இலவசமாக வழங்கப்படும் என அளித்த வாக்குறுதிக்கமையவே அப்பகுதி மக்கள் செலவுகளுக்கான பணத்தைச் செலுத்தியிராத நிலை ஏற்பட்டுள்ளது என்பதால், இவற்றை இலவசமாக வழங்குவதே சிறந்த ஏற்பாடாக இருக்கும் என்ற நிலையில், தற்போது ஆட்பதிவுத் திணைக்களமும் தங்களது அமைச்சின்கீழேயே இருப்பதால், இது தொடர்பில் சாதகமான நடவடிக்கையை விரைந்து எடுக்க முடியுமா?

மேற்படி எனது கேள்விகளுக்கான பதில்களையும் எடுக்கப் படக்கூடிய நடவடிக்கைகள் தொடர்பான விளக்கங்களையும் கௌரவ அமைச்சர் வஜிர அபேவர்தன அவர்கள் வழங்குவார் என எதிர்பார்க்கின்றேன்.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

ගරු කථානායකතුමනි, නිලමෙහෙවර ජනතා සේවා වැඩසටහන යාපන දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15ක් ආවරණ වන පරිදි, 2018 අගෝස්තු 24 වෙනි දින සිට 2018 ඔක්තෝබර් 15 වෙනි දින දක්වා පවත්වන ලදී. මෙම ජනතා සේවා වැඩසටහන තුළින් ජාතික හැඳුනුම්පත් ලබා දීම සහ වෙනත් සේවා විශාල ප්‍රමාණයක් නොමිලේ ලබාදීමට කටයුතු කරන ලදී. මීට පෙර මෙම ජනතා සේවා වැඩසටහන පැවැත්වූ පොළොන්නරුව, ගාල්ල, වවුනියාව, කිළිනොච්චිය, මුලතිව්, මන්නාරම හා කුරුණෑගල දිස්ත්‍රික්කවලද ජාතික හැඳුනුම්පත් නොමිලේ ලබාදීමට කටයුතු කරන ලදී. මෙම දිස්ත්‍රික්කයේ ජාතික හැඳුනුම්පත් නොමිලේ ලබාදීමට අනුග්‍රහය දැක් වූ පෞද්ගලික බැංකු කීපයක් 2018 ඔක්තෝබර් මස සිදු වූ ක්‍රියාවලිය නිසා අමාත්‍යාංශය සමඟ තිබූ සම්බන්ධතාව බිඳ වැටුණි. ඒ අනුව, යාපන දිස්ත්‍රික්කයේ ජනතාවට ජාතික හැඳුනුම්පත් නොමිලේ ලබාදීමට අනුග්‍රහය දැක් වූ, එකඟත්වය පළ කරන ලද ආයතන සමඟ නැවත කටයුතු කිරීමට මේ වන විට ක්‍රියාමාර්ග ගෙන ඇත. මේ සම්බන්ධයෙන් යාපන දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්තිරන් මන්ත්‍රීතුමා සහ විජයකලා මහේස්වරන් මන්ත්‍රීතුමිය ද ලිඛිතව අප අමාත්‍යාංශය වෙත තොරතුරු සපයා ඇත. ඒ කටයුතු සඳහා අප කල් ඉල්ලා තිබෙනවා.

ඒ අනුව ගෙවිය යුතු මුදල රුපියල් අටලක්ෂ විසිනවදහස් අටසිය පනහකි. එම මුදල ගෙවීමට එම ආයතන මේ වන විට සියලු කටයුතු කරමින් සිටී. ඒ අනුව, ජාතික හැඳුනුම්පත් අයදුම්කරුවන් සියලුදෙනාටම නොමිලේ ලබාදීමට කටයුතු කරනු ඇත. පමා වීම ගැන කනගාටුව ප්‍රකාශ කරනවා.

01. ඔව්.

02. ඔව්.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. DouglasDevananda)

தேர்தல்கள் வரவிருக்கின்றபடியினால் இந்த அடையாள அட்டைகள் வழங்குவதை விரைவுபடுத்துமாறு கேட்டுக்கொள்கின்றேன். மேலும், இலங்கையில் மாகாண சபைகளுக்கான தேர்தல்கள் எப்பொழுது நடாத்தப்படுமென்று ஏற்கெனவே நான் கேள்வியெழுப்பியிருந்தேன். கௌரவ அமைச்சர் அவர்கள் ஒரு குறிப்பிட்ட காலத்திற்குப் பிறகு பதில் சொல்வதாகக் குறிப்பிட்டிருந்தார். ஆனபடியால் அந்தக் கேள்விக்கான பதிலை இன்றா அல்லது இன்னொரு தினத்திலா? வழங்குவீர்கள் என்று கேட்க விரும்புகின்றேன்.

**ගරු වජිර අබේවර්ධන මහතා**
(மாண்புமிகு வஜிர அபேவர்தன)
The Hon. Wajira Abeywardana)

ගරු කථානායකතුමනි, එය ජාතික වශයෙන් තිබෙන ප්‍රශ්නයක් නිසා වෙනත් දිනයක සම්පූර්ණ පිළිතුරක් සැපයීමට කටයුතු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Is that all right, Hon. Member?

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

Yes.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, ගරු අනුර දිසානායක මැතිතුමා විසින් අසන ලද පොලිස් නිලධාරින්ගේ ප්‍රශ්නය, ජාතික පොලිස් කොමිසමට යොමු කරලා, ඒක ජාතික පොලිස් කොමිසම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට යොමු කළා. ඊට පසුව අපි භාණ්ඩාගාරයත් එක්ක ඒ ගැන කථා කළා. භාණ්ඩාගාරයේ නිලධාරින් සහ වැඩ බලන පොලිස්පතිතුමා සමඟ සාකච්ඡා කරලා එම දීමනා ගෙවීම සඳහා කටයුතු කරනවා. ඒ දෙගොල්ලන් ඒ දින සීමා සම්බන්ධයෙන් එකඟත්වයකට ආවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள், மலைநாட்டு மரபுரிமைகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise, Kandyan Heritage and Kandy Development and Leader of the House)
පොලීසියට මේ දීමනාව දෙනවාට ආණ්ඩුව කැමැතියි. වැඩියෙන් දෙන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන පොලිස්පතිතුමා සමඟ එකඟත්වයකට ඇවිල්ලා තිබෙනවා. වැඩි විස්තර මම දන්නේ නැහැ. මම ඒ සාකච්ඡාව පහසු කරලා දුන්නා. ඒක කෙරෙයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ දීමනා දෙන්න අපි කැමැතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත, දෙවැනි වර කියවීම.

**ගරු මහින්ද රාජපක්ෂ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Mahinda Rajapaksa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, අද දෙවැනිවර කියවීමට නියමිත ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධව ඔබතුමා දන්නවා. දැනටමත් මේ පනත් කෙටුම්පතට නීතිපතිවරයා විරුද්ධවෙලා තිබෙන බව දන්වා ඔබතුමාට ලිපියක් එවා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, නීතිපතිවරයා කියන විදියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත් පටහැනිව තමයි අද පනත් කෙටුම්පතට සංශෝධන ඉදිරිපත් කරන්න යන්නේ. ඒ නිසා ඒ සඳහා මෙය අවස්ථාවක් නොවෙයි. මේකට ඉංජිනේරු සංගමයත් විරෝධය ප්‍රකාශ කළා. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ බලය අමාත්‍යවරයාට පැවරීමට යනවා. එතකොට ඇමතිවරයාට අසීමිත බලයක් ලැබෙනවා. හැම දාම මේ ඇමතිවරයා ඉන්නේත් නැහැ. ඇමතිවරු මාරු වෙනවා. ඕනෑම මිලකට විදුලිය මිලදී ගැනීමේ බලය ඔවුන්ට ලැබෙනවා. මෙවැනි පනත් කෙටුම්පතක් මේ වාගේ අවස්ථාවක ඉදිරිපත් කිරීම ඉතාම නරක පූර්වාදර්ශයක් හැටියට තමයි අපි විශ්වාස කරන්නේ. මේ, ඒ සඳහා අවස්ථාව නොවෙයි. මේ පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත් විරුද්ධයි. මේ ඉදිරිපත් කරන පනත් කෙටුම්පතේම කියලා තිබෙනවා, ".....එහි දෙවන උපවගන්තියේ අතුරු විධානයේ මේ පනත බලාත්මක වීමට පෙරාතුවම වූ දිනයේ..." යන වචන ඉවත් කර ඒ වෙනුවට, "වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුවත්..." යනුවෙන්. ඒ කියන්නේ, මේක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත් උඩින් යනවා. ඒ නිසා මේ තුළින් ඔබතුමා පූර්වාදර්ශයක් දෙන්න එපා. මම ආණ්ඩු පක්ෂයෙන් ඉල්ලීමක් කරනවා අද මේ පනත් කෙටුම්පත ඉල්ලා අස් කරගෙන, මේ ගැන නැවත සාකච්ඡා කරලා යම් පියවරක් ගැනීම සුදුසුයි කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආංශික අධීක්ෂණ කාරක සභාවත් මේ පනත් කෙටුම්පතට යම් යම් සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බිමල් රත්නායක මැතිතුමාට අවස්ථාව දීලා, ඊට පසුව ඔබතුමාට අවස්ථාව දෙන්නම්. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මුලින් මේ පනත් කෙටුම්පත ගැන කථා කරමු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඔබතුමා පැහැදිලි කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, පක්ෂ නායක රැස්වීමේදී මේ පනත් කෙටුම්පත අද ඉදිරිපත් කරන්න අපි තීරණය කළා. නීතිපති දෙපාර්තමේන්තුවෙන් අපට මේ ගැන කිසිම දැනුම් දීමක් ලැබුණේ නැහැ. අද උදේ තමයි - I have the letter dated 6th August - අපට දැනුම් දුන්නේ, යම් යම් වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි කියලා. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්න. Wait, wait!

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපට අද උදේ තමයි ඒ ගැන දැනුම් දුන්නේ. ගරු විපක්ෂ නායකතුමා නැඟිටින්න කලින් මම නැඟිටලා මේ පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගන්නයි හැදුවේ. නමුත් එතුමා මට කලින් නැඟිට්ටා. [බාධා කිරීමක්] අපි කොහොමටත් මෙය ඉල්ලා අස් කරගන්නයි හිටියේ. අපිත් කැමැති නැහැ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධව කටයුතු කරන්න. [බාධා කිරීමක්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් points of Order ඕනෑ නැහැ නේ. [බාධා කිරීම්] Points of Order ඕනෑ නැහැ. Now, the Hon. Minister is withdrawing it.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
We are not proceeding with this. - [*Interruption.*]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
They are not proceeding with that.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් කැබිනට් නොවන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - பொருளாதார மறுசீரமைப்பு மற்றும் பொதுவழங்கல் அமைச்சரவை அந்தஸ் தற்ற அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - Non-Cabinet Minister of Economic Reforms and Public Distribution)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා ඇමතිතුමනි, මොකක්ද ඔබතුමාගේ ප්‍රශ්නය?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු කථානායකතුමනි, අපි Sectoral Oversight Committee එකේදී මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අපේ මතය ඉදිරිපත් කළා. අපි එකඟ වුණා, මෙයට සංශෝධන ඉදිරිපත් කරන්න. සංශෝධන ඉදිරිපත් කරන්න සූදානම් කියලා දැන් පිළිගත්ත නිසා ගැටලුවක් නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, we are not proceeding with it. So, you may adjourn Parliament.

***අවසර දෙන ලදුව, පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගන්නා ලදී.***
*சட்டமூலம், அனுமதியுடன் வாபஸ் பெறப்பட்டது.*
*Bill, by leave, withdrawn.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් යෝජනා කළා, - [බාධා කිරීමක්] මොකක්ද, ගරු විමල් වීරවංශ මැතිතුමනි? [බාධා කිරීමක්] Now, there is a proposal to adjourn the House. Does the House agree?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Then, we can adjourn the House. We do not have to go into an argument. We will adjourn the House now.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 2.30ට, 2019 අගෝස්තු 07වන බදාදා අ.භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 2.30 மணிக்கு பாராளுமன்றம், 2019 ஓகஸ்ட் 07, புதன்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 2.30 p.m. until 1.00 p.m. on Wednesday, 07th August, 2019.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர்  தமது உரையின்  இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.